3 කෘෂිකර්මය, ධීවර සහ වන සම්පත්

3.1 සමස්ත උපනතීන්

ශ්‍රී ලංකාව සියවස් ගණනාවක සිට කෘෂිකර්මයෙහි නියුතු වී සිටියද කෘෂිකාර්මික අංශය තවමත් ප්‍රධාන බෝග, එනම් වී, තේ, රබර්, පොල් සහ වෙනත් කෙෂ්ත්‍ර බෝග කිහිපයක් මත කේන්ද්‍රගත වී ඇත. මෙම කේන්ද්‍රගතවීම නිසා ජනතාවගේ ආදායම් වැඩිකර ගැනීමේ අනාගත අපේක්ෂාවන් පටුවන අතර එක් බෝගයක ඵලදාව මත රඳා පැවතීමේ අවදානමකටද මුහුණ පෑමට සිදුවේ. මෙම අංශයෙහි කෙටිකාලීන ක්‍රියාකාරිත්වය කාලගුණික තත්වය, රටේ ආරක්ෂක තත්වය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි වෙළඳ ද්‍රව්‍යවල මිල ගණන් මත රඳා පවතී. දිගුකාලීනව මෙම අංශයේ වර්ධනය තීරණය කරනු ලබන්නේ මූලික වශයෙන් පර්යේෂණ සහ සංවර්ධන ප්‍රයත්න, ව්‍යාප්ති සේවා, යටිතල පහසුකම්, දේශීය වෙළෙඳ ප්‍රතිපත්තිය, රජයේ මැදිහත්වීම සහ කෘෂිකර්මය පිළිබඳ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය යනාදිය මතය.

3.1 සංඛ්‍යා සටහන
කෘෂිකර්මය, පශු සම්පත් සහ මත්ස්‍ය අංශය - නිෂ්පාදන දර්ශක

(1997-2000 පාදක කාලසීමාව)

	2001	2002	2003 (අ)	වෙනස්වීමේ ප්‍රතිශතය 2002/03
කෘෂිකාර්මික සහ මත්ස්‍ය (සමස්ත)	100.9	103.3	104.9	1.5
1. කෘෂිකර්මය	100.3	102.1	105.0	2.8
1.1 කෘෂිකාර්මික බෝග	98.5	100.4	103.5	3.1
තේ	103.1	108.3	108.0	-0.3
රබර්	89.3	93.9	95.4	1.6
පොල්	99.7	86.1	92.3	7.2
වී	101.1	107.3	115.1	7.3
අනෙකුත් බෝග	94.7	98.7	98.9	0.2
1.2 පශු සම්පත්	116.2	117.1	117.7	0.5
2. මත්ස්‍ය	104.3	110.9	104.3	-6.0

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව අදළ ආයතන

පසුගිය දශකය තුළදී විශේෂයෙන්ම පුද්ගලික අංශයේ සහභාගිත්වය වැඩිවීම හේතුවෙන් ප්‍රධාන කෘෂිකාර්මික බෝගවල ඵලදායිතාවය ඉහළ ගියද ඒවායේ ඵලදායිතා මට්ටම් තවමත් විභව ඵලදායි මට්ටම්වලට වඩා පහළ මට්ටමක පවතී. බීජ සහ රෝපන ද්‍රව්‍යවලට අදළ අණපනත් ලිහිල් කිරීම, යම්තාක් දුරට අවශ්‍ය ඉඩම් ලබාගැනීමට හැකිවීම සහ රජයේ ගොවිපොළවල් පෞද්ගලීකරණය කිරීම ආදිය හේතුවෙන් පෞද්ගලික සමූහ ව්‍යාපාරවලට කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා විශාල වශයෙන් මැදිහත්වීමට ඉඩ සැලසිනි. මේ අතර රාජ්‍ය මූල්‍ය අංශයේ බාධා සහ අවශ්‍යතා සඳහා තරහකාරිත්වය වර්ධනයවීම මගින් පෙන්නුම් කරන්නේ ඉලක්ක කිරීමකින් තොර කෘෂිකාර්මික සහනාධාර නොකඩවා පවත්වාගෙන යාම තිරසාර නොවන බවයි. යටිතල පහසුකම් අවහිරතා හේතුවෙන් කෘෂිකාර්මික ද්‍රව්‍ය නිසි පරිදි බෙදා හැරීමට තවදුරටත් බාධා පැමිණි අතර එමගින් ගොවියාට ලැබෙන ආන්තිකය අඩුවිය. අවිධිමත් වෙළෙඳ ප්‍රතිපත්ති හේතුවෙන් අස්ථාවර භාවයක් ඇතිවීම නිසා කෘෂිකර්මය සඳහා දිගුකාලීන පෞද්ගලික ආයෝජනයන් අධෛර්‍යමත් විණි. ශ්‍රී ලංකාව සමග වෙළෙඳ සබඳතා පවත්වාගනු ලබන සමහර රටවල පැවති ආරක්ෂාකාරී වෙළෙඳ පිළිවෙත්, විශේෂයෙන්ම තේ සඳහා පැවති ආනයන සීමාවන් සහ ඉහළ තීරුබදු හේතුවෙන් වාණිජ කෘෂිකාර්මික බෝග වලින් ලබාගත හැකි සම්පූර්ණ විභවතාවය රටට ලබාගැනීමට නොහැකි විය.

කෘෂිකාර්මික, පශු සම්පත් සහ ධීවර අංශය 2003 වසරේදී එහි සමස්ත නිෂ්පාදනයේ සියයට 1.5 ක වර්ධනයක් පෙන්වීය. වී සහ පොල් නිෂ්පාදනයේ වර්ධනයට හිතකර කාලගුණික තත්වයන් උපකාර වූ නමුදු මැයි මාසයේ පැවති ගංවතුර ප්‍රධාන වශයෙන්ම පහත් බිම් ප්‍රදේශවල තේ නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑවේය. 2002 වසරේ මුල් කාලයේදී ඇරඹුනු සාමී ක්‍රියාදාමයෙන් උතුරු සහ නැගෙනහිර අනාරක්ෂිත ප්‍රදේශවල ඇතිවූ හිතකර ආරක්ෂක තත්වය නිසා වී සහ අනෙකුත් කෙෂ්ත්‍රබෝගවලට වාසිදායක තත්වයක් ඇතිවිය.

වී, රබර්, පොල් සහ අනෙක් කෙෂ්ත්‍ර බෝග ගණනාවක නිෂ්පාදනය වැඩිදියුණුවීම 2003 වසරේ කෘෂිකාර්මික අංශයේ සමස්ත වර්ධනයට දායක විය. වී නිෂ්පාදනය 2000 වසරේ පැවති වාර්තාගත නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් දහස් 2,860 සියයට 7 කින් ඉක්මවා යමින් නව වාර්තාගත නිෂ්පාදනයක් ලභාකර ගනු ලැබීය.

උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ආරක්ෂිත තත්වය වැඩිදියුණුවීමත්, වඩා හොඳ මෝසම් වැසි ප්‍රමාණයක් ලැබීමත් නිසා යල සහ මහ දෙකන්නයෙහිම වගා කළ සහ අස්වැන්න නෙලාගත් බිම් ප්‍රමාණය ඉහළ ගියේය. අර්තාපල් සහ ලොකු එෑණු හැරුනුකොට අනෙකුත් කෙෂ්ත්‍ර බෝගද 2003 වසරේදී වඩා හොඳ වර්ධනයක් පෙන්වීය.

මේ අතර බහුවාර්ෂික බෝග අංශය 2003 වසරේ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. පසුගිය දශකය තුලදී පැවති අවම පොල් නිෂ්පාදනය වාර්තා කරමින් 2002 වසරේ ඇතිවූ පසුබෑමෙන් මිදී පොල් නිෂ්පාදනය සියයට 7 ක වර්ධනයක් අත් කරගන්නා ලදී. ආකර්ෂණීය මිල ගණන්වලට යහපත් ප්‍රතිචාරයක් දක්වමින් රබර් නිෂ්පාදනයද සියයට 2 කින් ඉහළ නැංවිනි. කෙසේ වුවද 2002 දී වාර්තාගත නිෂ්පාදන මට්ටමක් ලභා කරගත් තේ නිෂ්පාදනය, 2003 වසරේදී පසුබෑමකට ලක්විය. මෙම පසුබෑමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ඉරාක යුද්ධය නිසා තේ වෙළෙඳපොළ තාවකාලිකව කඩා වැටීමත්, වසර මැද ඇතිවූ ගංවතුර සහ නායයෑම් හේතුවෙන් පහත් බිම් තේ වගා කරන ප්‍රදේශවලට සිදුවූ හානිකර බලපෑමත්ය.

මේ අතර නොකඩවා වසර තුනක කාලයක් අඩු නිෂ්පාදන මට්ටමක් පෙන්නුම් කළ සීනි නිෂ්පාදනය යථා තත්වයට පත්වී 2003 දී සියයට 45 ක වර්ධනයක් පෙන්වීය.

විශේෂ සටහන 7

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර අංශය සඳහා නිෂ්පාදන දර්ශකයක් ඇස්තමේන්තු කිරීම

හැඳින්වීම:

කෘෂිකර්ම අංශය විෂම ජාතීය උප අංශ කිහිපයකින් සමන්විත වන අතර එබැවින් මෙම අංශයෙහි සමස්ත ක්‍රියාකාරිත්වය අගැයීම අපහසු කාරියකි. එක් එක් විෂම ජාතීය උප අංශයන් සඳහා නිසියාකාර බර තැබීම් යොදා ගනිමින් නිෂ්පාදන දර්ශකයක් ගණනය කිරීම මෙම දුෂ්කරතාවය මග හරවා ගැනීමේ එක් ක්‍රමයකි.

විවිධ අවශ්‍යතා සඳහා නිෂ්පාදන දර්ශක ගණනය කරනු ලැබේ. එබැවින්, ආවරණය කරන අංශ, බරතැබීම්, පදනම් කාලය ලෙස යොදාගන්නා වර්ෂය ආදියේ වෙනස්කම් අනුව එක් එක් ආයතන මගින් සම්පාදනය කරන නිෂ්පාදන දර්ශක එකිනෙකට වෙනස්විය හැකිය. උදාහරණයක් ලෙස ගත් කළ ලෝක ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය (Food and Agriculture Organisation - FAO) මගින් විවිධ රටවල් සඳහා කෘෂිකර්ම නිෂ්පාදන දර්ශක සම්පාදනය කර ඇති අතර එමගින් 1989-91 පදනම් කාලයට සාපේක්ෂව එක් එක් වර්ෂය සඳහා මුළු කෘෂිකාර්මික නිෂ්පාදන පරිමාවේ මට්ටම පෙන්නුම් කරයි. මෙම ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නිෂ්පාදන දර්ශකවල ප්‍රධාන උප අංශ වනුයේ ධාන්‍ය, බෝග, ආහාර, පශුසම්පත්, සත්ව ආහාර සඳහා බෝග හැර අනෙකුත් ආහාර නොවන ද්‍රව්‍ය යනාදියයි. එම සංවිධානයේ නිෂ්පාදන දර්ශක සඳහා ප්‍රමාණයන් ගණනය කරනු ලබන්නේ බීජ හා සත්ව ආහාර සඳහා භාවිතා කරන ප්‍රමාණ අඩු කිරීමෙනි. එබැවින් දර්ශකය මගින් නියෝජනය වන්නේ බීජ හා සත්ව ආහාර හැරුනුකොට භාවිතයට ගතහැකි නිෂ්පාදනයයි. ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව කෘෂිකර්ම සහ පශුසම්පත් නිෂ්පාදන පරිමා දර්ශකයක් ගණනය කරනු ලැබේ. ඔවුන් විසින් තේ, රබර්, පොල්, වී, ගොඩ ගොවිතැන් බෝග, පශු සම්පත්, සුළු අපනයන බෝග සඳහා වෙන වෙනම දර්ශකද, සමස්ත දර්ශකයක්ද ගණනය කරනු ලැබේ. කෙසේ වුවද මෙම දර්ශකය ගණනය කරනු ලබන්නේ වසර දෙකක පමණ ප්‍රමාදයකින් පසුවය. එබැවින් කෘෂිකාර්මික අංශයේ සමස්ත ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා සියළුම උප අංශ ආවරණය වන පරිදි යාවත්කාලීන දර්ශකයක් ගණනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගිණි. මූල්‍ය කටයුතු විශ්ලේෂණයට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙම කාර්යය සිදු කරන ලදී.

දර්ශකයෙන් ආවරණය වන අංශ

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර යන උප අංශ තුනකින් සමන්විත වේ. කෘෂිකාර්මික අංශය මගින් ආවරණය කරනු ලබන්නේ වැවිලි බෝග, දේශීය කෘෂිකර්මයේ ප්‍රධානම බෝගය වන වී සහ අනෙක් ක්ෂේත්‍ර බෝග, එළවළු, පලතුරු, අපනයන කෘෂිකාර්මික බෝග, උක් සහ දුම්කොළ ඇතුලත් වන අනෙක් කෘෂිකාර්මික බෝග අංශයයි. පශු සම්පත් අංශය මගින් මස්, කිරි සහ බිත්තර නිෂ්පාදනය ආවරණය වේ. ධීවර අංශය මගින් මුහුදු, මිරිදිය හා ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය ආවරණය වේ. සමස්ත දර්ශකය වාර්ෂික පදනම මත සකස් කෙරේ. කෙසේ වුවද වැවිලි බෝග උප අංශය සඳහා දර්ශක කාර්තුමය පදනම මත සකස් කරන අතර වී, එළවළු, අනෙක් ක්ෂේත්‍ර බෝග සඳහා දර්ශක ද්විවාර්ෂික පදනම මත සකස් කෙරේ.

ගණනය කිරීමේ ක්‍රමය

1997-2000 කාලසීමාව තුල නිෂ්පාදනයේ සාමාන්‍ය අගය වාර්ෂික දර්ශක සඳහා පදනම් අගය ලෙස භාවිතා කරන ලදී. වසර හතරක සාමාන්‍ය අගය පදනම් අගය ලෙස යොදා ගැනීමට හේතුවූයේ වගා කාලසීමාවල් හා කාලගුණික රටා වෙනස්වීමෙන් නිෂ්පාදනයේ සිදුවන වෙනස්කම් හේතුවෙන් ඇතිවන දෝෂ මගහරවා ගැනීමටය. අර්ධ වාර්ෂික සහ කාර්තුමය දර්ශක ගණනය කිරීම සඳහා පාදක කරගනු ලැබුයේ වාර්ෂික අගය පිළිවෙලින් සමාන කොටස් දෙකකට සහ සමාන කොටස් හතරකට බෙදීමෙන් ලැබෙන අගයයි.

පරිමා දර්ශකය ගණනය කරන ලද්දේ ලැස්පෙයර්ස් ප්‍රමාන දර්ශකයට (Laspeyres quantity index) අනුවය.[1]

1 t වසර සඳහා ලැස්පේයර් දර්ශකය වන Q_t මෙසේ ගණනය කරනු ලැබේ.

$$Q_t = \frac{\Sigma i \; Pio \; Qit}{\Sigma i \; Pio \; Qio} \times 100$$

මෙහි p_{io} යනු i ද්‍රව්‍යයේ පදනම් වර්ෂයේ මිල වන අතර q_{io} යනු i ද්‍රව්‍යයේ පදනම් වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණයයි. q_{it} යනු t වසරේදී i ද්‍රව්‍යයේ නිෂ්පාදන ප්‍රමාණයයි. එක් එක් ද්‍රව්‍ය සහ සමජාතික ද්‍රව්‍යවල සම්පූර්ණ නිෂ්පාදන ප්‍රමාණය පදනම් කාලයේ අදළ ප්‍රමාණයෙන් බෙදීමෙන් දර්ශකය ලබා ගන්නා ලදී. විෂමජාතීය උප අංශවල උප අංශ දර්ශක ලැස්පේයර් දර්ශකය මගින් ගණනය කරන ලදී.

ලැබුයේ එක් එක් ද්‍රව්‍යයෙහි ප්‍රාථමික අවස්ථාව වන අතර එකතු කළ අගය සැලකිල්ලට නොගැණිනි. යම් අවස්ථාවක යම් සකස් කිරීමට ලක්වූ නිෂ්පාදිතයන් පිළිබඳ දත්ත භාවිතා කිරීමට සිදුවූ අවස්ථාවකදී හැකිතාක් දුරට එය ප්‍රාථමික තත්වයෙන් මැන බැලීම සඳහා සුදුසු පරිවර්තක අගයයන් භාවිතා කරන ලදී. (උදා : තේ සඳහා අමු දළු ප්‍රමාණය, රබර් සඳහා වියලි රබර්, පොල් සඳහා ගෙඩිපොල් ආදී වශයෙන්)

වටිනාකම් දර්ශකය ගණනය කිරීමේදී වර්තමාන වටිනාකම සහ පදනම් කාලයේ වටිනාකම අතර අනුපාතය භාවිතා කිරීමෙන් සරල දර්ශකයක් ගොඩ නගන ලදී.[2]

වටිනාකම් දර්ශකය සහ පරිමා දර්ශකය අතර අනුපාතය ලෙස මිල දර්ශකය ගණනය කරන ලද අතර එය පාසේ දර්ශකය වේ. (Pasche Index). [3]

ලබාගත හැකි දත්ත මත දර්ශකයෙන් ආවරණය වන පරාසය සීමා විය. රටෙහි වගා කරන සියළු එළවළු, පලතුරු සහ අනෙකුත් බෝගවල නිෂ්පාදන දත්ත ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සතුව නොපවතී.[4] දත්ත ලබාගත හැකි සෑම අවස්ථාවකදීම නිෂ්පාදනයට ලැබෙන මිල (ගොවිපොළ මිල) භාවිතා කරන ලදී. එසේ මිල ලබාගත නොහැකි අවස්ථාවලදී තොග මිල සහ සිල්ලර මිල අගයයන් ආශ්‍රයෙන් සුදුසු පරිදි ගොවිපොළ මිලක් ගණනය කරන ලදී. වී සඳහා ගොවිපොළ මිල ගණනය කිරීමේදී දිස්ත්‍රික්ක මට්ටමේ මිල

රූප සටහන 1
ප්‍රධාන කාණ්ඩ වල වටිනාකම් අනුපාත
(සාමාන්‍යය 1997 – 2000)



රූප සටහන 2
වාර්ෂික සමස්ත දර්ශක - කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර
(පදනම 1997-2000)



භාවිතා කරන ලදී. අනෙක් බෝග සඳහා සමස්ත දිවයිනේ නිෂ්පාදන මිලෙහි සාමාන්‍ය අගය භාවිතා කරන ලදී.

දර්ශක විශ්ලේෂණය

කෘෂිකර්ම නිෂ්පාදන පරිමා දර්ශකයන් විශාල වශයෙන්ම පෙන්නුම් කරන්නේ වැවිලි බෝග සහ වී වගා අංශයේ ක්‍රියාකාරිත්වයයි. එයට හේතුවන්නේ 1 වන රූප සටහනෙන් පෙන්වා ඇති පරිදි වී, තේ සහ පොල් යන බෝග තුන එක්ව ගත්කල මුළු කෘෂිකර්ම නිෂ්පාදනයේ වටිනාකමින් සියයට 50 කටත් වඩා වැඩි දායකත්වයක් දක්වීමයි.

සමස්ත දර්ශකය ඉහළයාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ අතර වී, තේ සහ පොල් නිෂ්පාදනය ඉහළ යාම නිසා 2000 වසරේදී එය මෙතෙක් ලබාගත් ඉහළම අගය වාර්තා කළේය. කෙසේ වුවද 2001 වසරේ පැවති නියහය හේතුවෙන් සමස්ත දර්ශකය පසුබෑමකට ලක්විය. 2002 වසරේදී පැවති වඩා හොඳ වී අස්වැන්නත්, වාර්තාගත තේ නිෂ්පාදනයත් හේතුවෙන් කෘෂිකාර්මික අංශය යථා තත්වයට පත්විය. 2

---

2 වටිනාකම් දර්ශකය

$$v_t = \frac{\Sigma i\ Pio\ Qit}{\Sigma i\ Pio\ Qio} \times 100$$ යන සම්කරණය මඟින්

දක්වෙන අතර p_{it} සහ q_{it} පිළිවෙලින් i ද්‍රව්‍යයේ t කාලසීමාවේ මිල හා i ද්‍රව්‍යයේ t කාලසීමාවේ ප්‍රමාණය වන අතර p_{io} හා q_{io} පිළිවෙලින් i ද්‍රව්‍යයේ පදනම් කාලයේ මිල හා i ද්‍රව්‍යයේ පදනම් කාලයේ ප්‍රමාණය වේ. වාර්ෂික/අර්ථ වාර්ෂික කාර්තුමය වටිනාකම් ගණනය කිරීමේදී එක් එක් ද්‍රව්‍යයේ/නිෂ්පාදනයේ උප අංශයට අයත් ද්‍රව්‍ය සහ මූලික අංශවලට අයත් ද්‍රව්‍යවල වටිනාකම පදනම් කාලයේ අදළ වටිනාකම්න් බෙදනු ලැබිය

3 පාෂේ දර්ශකය (Paasche Index)

$$p_t = \frac{\Sigma i\ Pit\ Qit}{\Sigma i\ Pio\ Qit} \times 100$$ යන සම්කරණයෙන් දක්වේ.

4 නිෂ්පාදන දත්ත නොමැතිවීම නිසා පලාවර්ග, විවිධ ශාකමය ද්‍රව්‍ය, මල් සහ විසිතුරු පැල, උණ, වේවැල්, ශාකතෙල් වැනි කොටස්, කුළුබඩු, දව නිෂ්පාදන ආදිය මෙම දර්ශකය ගණනය කිරීමේදී සැලකිල්ලට ගැනීමට නොහැකි විය.

වන රූප සටහනෙන් දක්වා ඇති පරිදි 2003 දී සමස්ත නිෂ්පාදන දර්ශකය තවදුරටත් ඉහළ ගිය අතර මෙයට හේතුවූයේ වී අස්වැන්න විශාල ලෙස ඉහළ යාමයි. අනෙක් කෘෂිබෝග අංශයෙහි නිෂ්පාදන දර්ශකය පදනම් කාලයට සාපේක්ෂව පසුබැස්මක් පෙන්නුම් කළ අතර ඊට හේතුවූයේ මිරිස්, එෑණු, කව්පි, මුං හා ඉරිඟු වැනි සමහර ක්ෂේත්‍ර බෝග සහ සමහර පලතුරු වර්ග හා උක් නිෂ්පාදනය මෑත කාලයේ පහළ ගිය බැවිනි. පෞද්ගලික අංශයේ සහභාගිත්වය හේතුවෙන් කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය ඉහළයාම නිසා පශු සම්පත් අංශයේ නිෂ්පාදන ඉහළ යාමක් පෙන්වීය. කිරි එකතු කිරීමේ ජාලය වැඩිදියුණු කිරීම මෙන්ම නැවුම් කිරි සඳහා ගෙවන මිල ඉහළයාම නිසා කිරි නිෂ්පාදනයද වැඩිදියුණු විය.

මිල දර්ශකයෙන් පෙන්නුම් කරන පරිදි මිල දර්ශකය 2000 වසරේ මිල පහත වැටීමට හේතුවූයේ අධික අස්වැන්නක් ලැබීම හේතුවෙන් වී සහ පොල් මිල සාපේක්ෂව පහත වැටීමයි. කෘෂි බෝග උප අංශය මෙන් නොව පශු සම්පත් හා ධීවර උප අංශවල මිල හා වටිනාකම් දර්ශක නොකඩවා ඉහළයාමක් පෙන්වයි.

රූප සටහන 3
වාර්ෂික නිෂ්පාදන පරිමා දර්ශක
ප්‍රධාන කාණ්ඩ (පදනම 1997-2000)



රූප සටහන 4
වාර්ෂික කෘෂිකර්මික මිල දර්ශක - ප්‍රධාන කාණ්ඩ
(පදනම 1997-2000)



පැල්වත්ත සහ සෙවනගල කම්හල් දෙකෙහිම ප්‍රධාන කොටස් පෞද්ගලීකරණය කිරීමෙන් ඇති වූ හිතකර දිරිගැන්වීම මෙම දියුණුවට සෘජු ලෙස බලපෑවේය.

3.2 කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සහ ආයතනික පහසුකම්

ඕනෑම ආර්ථිකයක කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ඉලක්ක කරගත යුත්තේ, අනෙකුත් තරඟකාරී රටවල් සමග සාර්ථකව තරඟ කළහැකි තිරසාර පැවැත්මක් ඇති කෘෂිකාර්මික අංශයක් වර්ධනය කරගැනීම සහ කෘෂිකර්මාන්තයේ නියැලුනු ගොවියන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගැනීමයි. මෙම අවසාන අරමුණු කරා ලඟාවීමට නම් නව තාක්ෂණයට හැඩ ගැසීමට ඇති හැකියාව සහ නම්‍යශීලීභාවය මෙම අංශයට තිබිය යුතු අවශ්‍යතාවය වන අතර එමඟින් ඵලදායිතාවය වැඩිකර ගැනීම තුළින් සාමාන්‍ය පිරිවැය තරඟකාරී ලෙස අඩු මට්ටමක පවත්වාගත හැකිවනු ඇත. එවැනි කෘෂිකාර්මික ප්‍රතිපත්ති සාමාන්‍යයෙන් ඉතා පුළුල් පරාසයක් ආවරණය කරනු ලබන අතර, කෘෂිකාර්මික පර්යේෂණ, නව තාක්ෂණය සහ එය පිරිවැයකින් තොරව බෙදීම, බෝග විවිධාංගීකරණය, ලිහිල්කරණය, රෙගුලාසි ලිහිල් කිරීම පුද්ගලිකකරණය හරහා දිරි ගැන්වීම, මිල ස්ථාවරව පවත්වා ගෙනයාම, යෙදවුම් කළමනාකරණය, සහනාධාර ව්‍යාප්ති සේවා සහ තිරසාර සංවර්ධනයක් සඳහා පරිසරය සුරැකීම යනාදිය එයට ඇතුලත් වෙයි. බාහිර වශයෙන් නොකඩවා සහයෝගය ලබාදීමෙන් තොරව මෙම අංශයට පෙරට ගමන් කිරීම සඳහා ඉහත ප්‍රතිපත්ති තුළින් සුදුසු දිරිගැන්වීම් ව්‍යුහයක් ස්ථාපනය කළයුතුව ඇත. කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය සහ කෘෂිකාර්මික පර්යේෂණ සහ ප්‍රතිපත්ති සභාව මගින් නිකුත් කරන ලද ප්‍රකාශන දෙකක් මගින්, රටෙහි කෘෂිකාර්මික ප්‍රතිපත්තිය එළි දක්වා ඇත. කෘෂිකාර්මික අංශයෙන් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය සහ ආයෝජනයට ලබාදෙන ප්‍රතිලාභ ප්‍රමාණය එහි විභවතා මට්ටමට වඩා ඉතා අඩු මට්ටමක පවතින බැවින්, කෘෂිකාර්මික අංශය නගා සිටුවීම සඳහා මෙම ප්‍රතිපත්ති සැලැස්ම සකස්කර ඇත.

කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය මගින් 2003 සිට 2010 කාලසීමාව වෙනුවෙන් කෙටුම්පත් කරන ලද කෘෂිකර්මය සහ පශු සම්පත් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය මගින්, දේශීය කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් කර්මාන්තය තිරසාර හා ප්‍රබල ආර්ථික බලවේගයක් බවට පත් කිරීම සඳහා, රාජ්‍ය අංශය සහ පුද්ගලික අංශය යන දෙඅංශයේ සම්බන්ධවීම සහ මානව සම්පත් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. බිම් ප්‍රමාණය පුළුල් කිරීම සීමාසහිත බැවින්, නිෂ්පාදන තාක්ෂණය වැඩිදියුණු කිරීමට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. කෘෂිකාර්මික පර්යේෂණ සහ ප්‍රතිපත්ති සභාව මගින් සකස් කරන ලද ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය, එයට ඌණපූරනයක් වශයෙන් පැළ බෝ කිරීම, බෝග වැඩිදියුණු කිරීම, අභිජනනය කරන ලද බීජ වැඩිදියුණු කිරීම ඒකාබද්ධ පලිබෝධ පාලනය,

ජීව පලිබෝධනාශක හා ජීව පොහොර වැඩිදියුණු කිරීම, වාරි ජල කළමනාකරණය, පසෙහි සරුබව පවත්වාගෙන යාම, පලතුරු, විසිතුරු මල් හා පැළ වගා වැඩිදියුණු කිරීම, සහ පසු අස්වනු පිරිසැකසුම යන අංශ සඳහා තාක්ෂණය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් ඉල්ලුම් මූලික පර්යේෂන සිදු කිරීමෙහි ඇති අවශ්‍යතාවය අවධාරණය කරයි. මෙම ප්‍රතිපත්තිය මගින් ව්‍යාප්ති සේවා ක්‍රමානුකූල කිරීම සහ නොරතුරු තාක්ෂණය බෙදා හැරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමටද උත්සාහ කෙරේ.

වෙළඳපොළ ප්‍රතිසංස්කරණය, කෘෂිකර්ම අංශය සඳහා පෞද්ගලික ව්‍යවසායකයන්ගේ කාර්යභාරය වැඩිදියුණු කිරීම, ආහාර සකස්කිරීමේ කර්මාන්තය සමග සමීප සම්බන්ධයක් ගොඩනගා ගැනීම, සම්පත් සංරක්ෂණය කිරීම සහ සම්පත් නිරසාර ලෙස භාවිතා කිරීම වැනි අංශ කිහිපයක් ප්‍රතිසංස්කරණය කළයුතු අංශ ලෙස කෘෂිකර්මය සහ පශු සම්පත් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන ඇත. 2003 වසරේදී රජයේ ප්‍රයත්නයන් යොමුවූයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම හා බෝග විවිධාංගීකරණය, අලෙවිකරණයේ යටිතල පහසුකම් වර්ධනය කිරීම, පුද්ගලික අංශයේ සහභාගිත්වය වැඩිකිරීම, යෙදවුම් කළමනාකරණය සහ කෘෂිකාර්මික බෝගවල මිල ස්ථායිව පවත්වාගෙන යාම පිළිබඳවයි.

ඵලදායිතාවය සහ බෝග විවිධාංගීකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින් කෘෂිකාර්මික පර්යේෂණ සහ ප්‍රතිපත්ති සභාව විසින් විවිධ පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සහ පුද්ගලික අංශ මගින් ශාක අභිජනනය, ශාක ව්‍යාධිවේදය, ආහාර තාක්ෂණ විද්‍යාව, පස සහ පොහොර වැඩිදියුණු කිරීම, ශෂ්‍ය විද්‍යාව, උද්‍යාන විද්‍යාව සහ ශාක සංරක්ෂණය වැනි විවිධ ක්ෂේත්‍රවලට අදාළව සිදුකරන ලද පර්යේෂණ ව්‍යාපෘති 83 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 118 ක් ප්‍රදානය කරන ලදී.

අලෙවිකරණය වෙනුවෙන් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ආර්ථික මධ්‍යස්ථාන 2 ක් 2003 වසරේ මීගොඩ සහ ඇඹිලිපිටියේ ඉදිකරන ලදී. මෙම මධ්‍යස්ථාන මගින් ගොවීන්ට තම නිෂ්පාදන සිල්ලර සහ තොග වෙළඳුන් වෙත වඩා හොඳ මිලකට විකිණීමට අවශ්‍ය පහසුකම් සැපයේ. ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය ජනප්‍රිය කිරීමේ ප්‍රයත්නය මෙම වසර තුලදීද ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නොකඩවා සිදුකරන ලදී. මෙම ක්‍රමයේ අමතර ලක්ෂණයක් වන්නේ නිෂ්පාදකයා සහ ගැනුම්කරුවා යන දෙපාර්ශ්වයටම සහභාගිත්ව බැංකුව හරහා ණය ලබාගැනීමට හැකි වීමයි.

2003 වසරේදී, බීජ පනත පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නා ලද අතර, එමගින් හොඳ තත්වයේ බීජ සහ රෝපන ද්‍රව්‍ය ලබාගැනීමේ ගොවියා සතු අයිතිය ආරක්ෂා කෙරෙන අතර බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තයේ තත්වය ඉහළ නැංවීමටද ඉඩ සැලසේ.

ඉරාක යුධ සමයේ තේ මිල පහත වැටීම හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දුන් පෞද්ගලික තේ කම්හල් හිමියන් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සියයට 50 ක සහන පොලී පදනමක් මත කාරක ප්‍රාග්ධන ණය ක්‍රමයක් ප්‍රදානය කරන ලදී. තවද, ගංවතුරින් විපතට පත් කම්හල් හිමියන්ගේ හානිවී ඇති යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම්වලට ගෙවීම සඳහාද ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් රුපියල් දශ ලක්ෂ 10ක් වෙන් කරන ලදී. 2003 මැයි මස ගංවතුරින් විපතට පත් ගාල්ල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල තේ කම්හල් හිමියන්ගේ අමු දළු සහ සැකසූ තේ වලට සිදුවූ හානිය වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 45.7 ක වන්දි මුදලක් රජය මගින් ප්‍රදානය කරන ලදී.

පොහොර සහනාධාර ක්‍රමය 2003 වසර තුළදී ද නොකඩවා ක්‍රියාත්මක විය. ඒ අනුව යූරියා සඳහා ජාත්‍යන්තර මිල ගණන් සැලකිල්ලට ගැනීමෙන් තොරව යූරියා මෙට්‍රික් ටොන් 1 ක් සඳහා රුපියල් 6,000 ක ස්ථිර සහනාධාර මුදලක් ප්‍රදානය කරන ලදී. නව සහනාධාර ක්‍රමයෙන් බලාපොරොත්තු වූ පරිදි ජාත්‍යන්තර මිල ගණන් අඩු මට්ටමක පවතින විට යූරියා ආනයනය කිරීම දිරි ගැන්විනි.

කෘෂිකාර්මික සංවර්ධනය වෙනුවෙන් පුද්ගලික අංශයේ සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා රජය මගින් විශේෂිත ප්‍රයත්න දරන ලදී. තේ කර්මාන්තයේ මූලික කොටස්කරුවන් 6 දෙනෙකුගෙන් සමන්විතව ශ්‍රී ලංකා තේ සංගමය (Tea Association of Sri Lanka) පිහිටුවන ලද අතර, එය තේ කර්මාන්තයේ සියළු කොටස් ඒකරාශී කරන ආයතනයක් වේ. මෙහි මූලික කොටස්කරුවන් වන්නේ ලංකාවේ තේ වැවිලිකරුවන්ගේ සංගමය (Planters Association of Ceylon) කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය, (Colombo Tea Traders Association of Ceylon), තේ අපනයනකරුවන්ගේ සංගමය (Tea Exporters Association), ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු සංවර්ධන සමිති හවුල (Sri Lanka Federation of Tea Small Holdings Development Societies) පුද්ගලික තේ කම්හල් අයිතිකරුවන්ගේ සංගමය (Private Tea Factory Owners Association) සහ කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමයයි. (Colombo Brokers Association). ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් සපයනු ලබන වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය (Plantation Development Project) මගින් මෙම සංගමයේ මූලික අවධිය සඳහා අරමුදල් සපයනු ඇත. පුද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා රබර් පර්යේෂණායතනයේ කමිටු සාමාජිකයන් සංඛ්‍යාව එකොළොස් දෙනෙකු දක්වා ඉහළ නැංවීමට පාර්ලිමේන්තු පනතක් සම්මත කරගන්නා ලදී. මෙම කමිටු සාමාජිකයන් එකොළොස් දෙනා අතුරින් සත් දෙනෙක් රබර් කර්මාන්තයේ විවිධ අංශවල නියුතු පුද්ගලික අංශය නියෝජනය කරනු ලැබේ.

වසර 2003 දී වැවිලි සමාගම් 13 ක් පාලනය කරන්නාවූ කළමනාකරණ නියෝජිතායතන 10 ක් සිය කළමනාකරණ ගාස්තු සියයට 50 සිට සියයට 10-20 අතර මට්ටමකට අඩු කිරීමට එකඟ විය. මෙම අඩු ගාස්තු ව්‍යුහය පදනම් වන්නේ

පොලි ගෙවීම, සංස්ථාපිත බදු, ක්ෂයවීම සහ ක්‍රමක්ෂය වෙන් කිරීම්වලට පෙර කරන ලද ලාභාංශ ප්‍රතිශතය මත සකසන ලද සමීකරණයකට අනුකූලවය. මෙම ගාස්තු, අදාළ ගිවිසුමේ අවසාන වසර වන 2008 වනවිට සියයට 10 ක් දක්වා අඩුවන පරිදි ක්‍රම ක්‍රමයෙන් පහත හෙලීමට අපේක්ෂිතය. මෙම නව ව්‍යුහය යටතට ගැනෙන සමාගම් සහනදායී පොලී අනුපාතය කට යටත්ව ආසියානු සංවර්ධන බැංකුව ලබාදෙන එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 135 ක ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත.

2003 වසරේදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ පවතින පාඩු ලබන ගොවිපළ 9 ක් පුද්ගලීකරණය කිරීමෙන් හෝ කළමනාකරණ නියෝජිතයන් පත්කිරීම තුලින් ප්‍රතිව්‍යුහගත කිරීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය දී ඇත. මෙසේ හඳුනාගන්නා ලද ගොවිපළ අතර රිදියගම ගොවිපළ, කන්දකඩුව ගොවිපළ (උතුරුමැද), කන්දකඩුව ගොවිපළ (දකුණ), හාරගම ගොවිපළ, ඉපිල් ඉපිල් ගොවිපළ, මාර්ටින් ගොවිපළ, වැලිකන්ද ගොවිපළ, කොට්ටුකච්චිය ගොවිපළ සහ පරසන්ගහවැව ගොවිපළ වේ.

තීරුබදු පිළිබඳව සලකා බැලීමේදී සහල් සඳහා වන විශේෂිත බද්ද 2003 මාර්තු මස 5 වැනි දින කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 7 දක්වා ඉහළ නැංවූ අතර 2003 අගෝස්තු 21 වන දින එය නවදුරටත් කිලෝග්‍රෑමයට රුපියල් 9 දක්වා ඉහළ නංවන ලදී. 2003 සැප්තැම්බර් මස 4 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලොකු ඵැණු සඳහා වූ කිලෝග්‍රෑමයට රුපියල් 6 ක් වන සහ සීනි සඳහා වූ කිලෝග්‍රෑමයට රුපියල් 3.50 ක් වන විශේෂිත බදු පිළිවෙලින් කිලෝග්‍රෑමයකට රුපියල් 8 සහ රුපියල් 3.75 දක්වා ඉහළ නංවන ලදී.

ක්‍රමිකව සිදුවෙමින් පවතින ලිහිල්කරණය, විවෘත භාවය සහ ගෝලීයකරණය තුලින් පැන නැගෙන ගැටළු හා අභියෝගවලට කෘෂිකාර්මික අංශය මුහුණ දෙමින් සිටී. පරස්පර විරෝධී ප්‍රතිපත්ති සහ ලිහිල්කරණය සඳහා නිශ්චිත කාල රාමුවක් නොතිබීම නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආයෝජනයන්ට බාධා පැමිණේ. කෘෂිකාර්මික ශ්‍රම හිඟය නවදුරටත් තදබල ගැටළුවක්ව පවතී. මෙම ප්‍රශ්නය තවත් උග්‍ර වනුයේ ඉඩම් කුඩා කැබලිවලට කැඩී යාම හේතුවෙන්, ශ්‍රමය වෙනුවට යන්ත්‍ර ආදේශ කිරීමට නොහැකි වන බැවිනි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය ස්ව ශක්තියෙන් තිරසාර මාවතකට ලභාවන තෙක් ජාත්‍යන්තරව හා දේශීයව වර්ධනය වෙමින් පවත්නා නව නිර්මාණ හරහා සාම්ප්‍රදායික ක්‍රමය ඉවතට තල්ලු වීමට එරෙහි වීම ඉතා අසීරු වනු ඇත. කෙසේ වුවද, මෙම අංශය එහි වර්තමාන තත්වයෙන් ගොඩගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගන්වන අතරම යහපත් සාර්ව ආර්ථික වාතාවරණයකන් සකස් කිරීම නොකඩවා සිදු කළයුතුව ඇත.

3.3 අපනයන බෝග

තේ

2002 වසරේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 310 ක් වූ වාර්තාගත තේ නිෂ්පාදනය 2003 වසරේදී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 303 දක්වා සියයට 2 කින් පහත වැටිනි. ගං වතුර සහ නායයෑම් පහත් බිම් තේ නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑ අතර 2003 වසරේ දෙසැම්බර් මස පැවති වියලි කාලගුණික තත්වය සියළුම බිම් මට්ටම්වල තේ නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑවේය. උස්බිම් තේ නිෂ්පාදනය ඉකුත් වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් දශ ලක්ෂ 32 දක්වා සියයට 6 කින් අඩු වූ අතර මැදි බිම් තේ නිෂ්පාදනයද ආන්තිකව අඩුවිය. සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 55 කට දායක වූ පහත් බිම් තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 168 ක් වූ අතර, එය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 1 ක අඩුවීමකි. කපා ඉරා අඹරන (CTC) ලද තේ නිෂ්පාදනය 2002 වසර සමග සැසඳීමේදී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 17.6 දක්වා සියයට 1 කින් පහළ වැටුණි. මේ අතර මිශ්‍ර කර නැවත අපනයනය කිරීම සඳහා ආනයනය කරන ලද තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 2.5 සිට කිලෝග්‍රෑම් දශ ලක්ෂ 4.5 දක්වා වැඩි විය.

ඉකුත් වසරේ මෙන්ම 2003 වසරේදී ද, කුඩා තේ වතු අංශය ජාතික තේ නිෂ්පාදනයෙන් සියයට 62 කට දායක වෙමින් තේ කර්මාන්තය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් පවතී. කුඩා වතු හිමියන්ගෙන් සියයට 82 ක් පමණ කේන්ද්‍රගතව සිටින්නේ පහත් බිම් ප්‍රදේශ වලයි. ගං වතුරින් ඇතිවූ අහිතකර බලපෑම් හේතුවෙන් 2003 වසරේදී කුඩා තේ වතු අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 2,267 ක් දක්වා සියයට 1 කින් පහළ වැටුණි. 2003 වසරේ වතු වගා අංශය සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1,399 ක්

3.1 රූප සටහන
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක: තේ
(1990 = 100)



වූ අතර ඇස්තමේන්තුගත ජාතික සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,875 ක් විය.[1]

ඉන්ධන මිල හා විදුලිබල ගාස්තු, පොහොර, කෘෂි රසායන

1 වතු වගා අංශයේ ඵලදායිතාවය ගණනය කිරීමේ දී පාදක කරගනු ලැබුවේ වැවිලි සමාගම් වලින් ලබාගත් දළු නෙළන බිම් ප්‍රමාණයන් වන අතර, කුඩා වතු අංශයේ ඵලදායිතාවය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ලබාදෙන ලදී.

3.2 සංඛ්‍යා සටහන
තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා

අයිතමය	ඒකකය	2001	2002(අ)	2003(ආ)
1. නිෂ්පාදනය	කි.ග්‍රෑ.දශ ලක්ෂ	295	310	303
උස් බිම්	කි.ග්‍රෑ.දශ ලක්ෂ	75	87	82
මැදි බිම්	කි.ග්‍රෑ.දශ ලක්ෂ	54	54	54
පහත් බිම්	කි.ග්‍රෑ.දශ ලක්ෂ	166	169	168
2. බිම් ප්‍රමාණය				
මුළු වගා බිම් ප්‍රමාණය(ඇ)	හෙක්ටයාර් දහස්	180	189	188
දළු කැපීම යටතේ ඇති(ඇ)	හෙක්ටයාර් දහස්	165	165	165
3. පොහොර භාවිතය	මෙට්‍රික් ටොන් දහස්	167	185	167
4. නැවත වගා කිරීම	හෙක්ටයාර්	1,018	1,029	936
5. අළුතින් වගා කිරීම	හෙක්ටයාර්	402	562	642
6. මිල				
කොළඹ	කි.ග්‍රෑ./රුපියල්	143.96	149.30	149.05
අපනයන(නැව්ස.)	කි.ග්‍රෑ./රුපියල්	208.89	216.26	221.01
7. නිෂ්පාදන පිරිවැය(ඉ)	කි.ග්‍රෑ./රුපියල්	121.57	124.06	135.58
8. අපනයන	කි.ග්‍රෑ.දශලක්ෂ	295	292	298
9. අපනයන ඉපැයුම්	රුපියල් දශ ලක්ෂ	61,602	63,105	65,936
	එ.ජ.ඩොලර් දශ ලක්ෂ	690	660	683
10. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඊ)		2.3	2.4	2.3

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 1999 දී වතු වගා අංශයේ සමීක්ෂණයකට අනුව 1999 සිට වගා කරන ලද බිම් ප්‍රමාණය සංශෝධනය කරන ලදී. (අත් හරින ලද තේ ඉඩම් ඇතුළත් නොවේ)
(ඈ) වතු සමාගම් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සපයන ලද දත්ත පදනම් කරගෙන සකස් කරන ලදී.
(ඉ) අමු තේ දළු සැපයුම්කරුගේ ලාභාංශද ඇතුළත් වේ
(ඊ) වගා කිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.

ද්‍රව්‍ය ආදී යෙදවුම්වල මිල ඉහළයාම නිසා තේ වගා අංශයේ නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයට රුපියල් 135.58 දක්වා සියයට 9.3 කින් ඉහළ ගියේය. 2002 වසරේ ජූලි මාසයේදී ක්‍රියාත්මක වූ වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීම ද නිෂ්පාදන පිරිවැය වැඩිවීමට දායක විය. තේ නිෂ්පාදනය අඩුවීමට සමගාමීව 2003 වසරේ කොළඹ තේ වෙන්දේසියේ අලෙවි කරන ලද තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 304 දක්වා සියයට 2 කින් අඩුවිය. කොළඹ තේ වෙන්දේසියේ වාර්ෂික සාමාන්‍ය මිල ගණන් රුපියල් වලින් ගණනය කිරීමේදී කිලෝග්‍රෑමයකට රුපියල් 149.05 දක්වා ආන්තිකව අඩුවූ අතර එක්සත් ජනපද ඩොලර් වලින් ගණනය කිරීමේදී එය කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 1.54 දක්වා සියයට 1 කින් අඩුවී ඇත. 2003 වසර මුල් භාගයේ පැවති ඉරාක යුද්ධය හේතුවෙන් ඇතිවූ අවිනිශ්චිත බව නිසා තේ මිලෙහි සිදුවූ පහළ වැටීම මෙයින් පිළිබිඹු වේ. තවද, 2003 වසරේ තේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල්වල නිෂ්පාදනය ඉහළ යාම නිසා ලෝක තේ මිල ආකර්ෂණීය නොවීය. අඩු මිල මට්ටම සහ අධික නිෂ්පාදන පිරිවැය නිසා බොහොමයක් වැවිලි සමාගම් මූල්‍ය අපහසුතාවලට මුහුණ දුන් අතර එය වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන ආයෝජන, සංවර්ධන කටයුතු සහ නැවත වගා කිරීමේ කටයුතු අඩපණ කිරීමට සමත් විය. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන වැවිලි සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් පමාවීම නිසා වැවිලි සමාගම් යටතේ ඇති සමහර වතුවල සංවර්ධන කටයුතු අඩාල විය.

2003 වසරේ තේ අපනයනය ඉකුත් වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් දශ ලක්ෂ 298 දක්වා සියයට 2 කින් වැඩිවිය. මෙයට හේතු වූයේ 2002 වසරෙන් ඉදිරියට රැගෙන ආ තොග ප්‍රමාණය අඩුවීමයි. තේ අපනයනයෙන් ලද මුළු ආදායම රුපියල් බිලියන 66 ක් (එ.ජ.ඩො.මිලියන 683 ක්) වූ අතර එය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 4.5 ක වැඩිවීමකි. පැකට් කරන ලද තේ, තේ මළු සහ ක්ෂණික තේ වැනි එකතු කරන ලද අගය සහිත තේ අපනයනය වැඩිවීම නිසා තොග වශයෙන් තේ අපනයනය කිරීම සියයට 64 සිට සියයට 59 දක්වා අඩුවිය. මෙය 2003 වසරේ තේ සඳහා සාමාන්‍ය අපනයන මිල ඉහළ දැමීමට සමත් විය.

ක්ෂණිකව පානය කළහැකි තේ (Ready to Drink Tea) නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහනාධාර පොලී ක්‍රමයක් යටතේ මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ බැංකු සහ පිළිගත් මූල්‍ය ආයතන වලින්, ක්ෂණිකව පානය කළ හැකි තේ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා ලබාගන්නා ණය මුදල්වල පොලී ප්‍රමාණයෙන් සියයට 50 ක සහනාධාරයක් අවුරුදු 5 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් ලබාදෙනු ඇත. මේ යටතේ ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය එක ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශ ලක්ෂ 20 කි.

උපදේශක සහ ව්‍යාප්ති සේවා සැපයීම තුලින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය තවදුරටත් කුඩා තේ වතු හිමියන්ට අතදීම නොකඩවා සිදු කළේය. කුඩා තේ වතු හිමියන් නැවත වගාව සහ නව වගාව කෙරේ උනන්දු කිරීම පිණිස කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් විවිධ සහනාධාර ක්‍රමයන් ක්‍රියාත්මක කරන ලදී. 2003 වසර සඳහා තේ නැවත වගාව, නව වගාව සහ අඩු පැළ සිටුවීම (infilling) සඳහා කුඩා තේ වතු හිමියන්ට නිකුත් කර ඇති සම්පූර්ණ සහනාධාර ප්‍රමාණය රුපියල් මිලියන 157 ක් වේ. තවද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් ණය පහසුකම් මත පොහොර බෙදා හැරීමේ වැඩසටහන 2003 වසරේ දී ද ක්‍රියාත්මක කරන ලදී.

රබර්

රබර් නිෂ්පාදනය ඉහළයාම දෙවන වසරටත් අඛණ්ඩව පැවති අතර 2003 වසරේ රබර් නිෂ්පාදනය ඉකුත් වසරට සාපේක්ෂව කිලෝග්‍රෑම් දශ ලක්ෂ 92 දක්වා සියයට 1.6 කින් ඉහළ ගියේය. වසර පුරා පැවති ආකර්ෂණීය මිල ගණන්, කිරි කැපීමේ නිවුතාවය වැඩි කිරීමට වගාකරුවන් දිරිමත් කළ අතර එය රබර් නිෂ්පාදනය ඉහළ යාමට හේතු විය. කෙසේ වෙතත් 2003 වසරේ වැසි දින සංඛ්‍යාව අධිකවීම, රබර් නිෂ්පාදනය එහි විභවතා මට්ටමට ලඟාවීම වැළැක්වීය.

ෂීට් රබර් නිෂ්පාදනයේදී ලබාගත හැකි ඉහළ ලාභාන්තිකය හේතුවෙන් ක්‍රේප් රබර් නිෂ්පාදකයන් ෂීට් රබර් නිෂ්පාදනය කෙරේ නැඹුරුවීම දක්නට ලැබුණි. ඒ අනුව 2003 වසරේ ෂීට් රබර් නිෂ්පාදනය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 17 කින් ඉහළ ගියේය. 2002 වසරේදී මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 47 කට දායක වූ ෂීට් රබර් නිෂ්පාදනය, 2003 වසරේදී සියයට 53 ක් විය. මේ අතර ඉකුත් වසරේ මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 29 ට දායක වූ ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 14 කින් පහළ වැටුණ අතර එය මුළු රබර් නිෂ්පාදනයෙන් සියයට 24 කට දායක විය. 2002 අප්‍රේල් සිට ඇරඹී කොළඹ වෙන්දේසියේ රබර් මිල ඉහළ යාමේ ප්‍රවනතාවය, 2003 වසරේද නොකඩවා පැවතුණි. කොළඹ වෙන්දේසියේ සියළුම ශ්‍රේණිවල රබර් මිල ගණන් රුපියල් වලින් ගණනය කිරීමේදී මෙතෙක් වාර්තාගත ඉහළ මට්ටමට ලභා විය. සියළුම ආර්.එස්.එස් ශ්‍රේණිවල මිල ගණන් රුපියල් වලින් ගණනය කිරීමේදී සියයට 50 කින් පමණ ඉහළ ගියේය. ක්‍රේප් රබර් සඳහා වාර්ෂික සාමාන්‍ය මිල රුපියල් වලින් ගණනය කරන විට සියයට 60 කින් පමණ ඉහළ ගොස් ඇත.

2003 වසරේ සාමාන්‍ය රබර් අස්වැන්න හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 911 ක් විය. මෙය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 26 කින් ඉහළ යාමකි. කෙසේ වෙතත් මෙය රබර් පර්යේෂණායතනය මගින් ඇස්තමේන්තු කර ඇති විභව අස්වනු ප්‍රමාණය වන හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,500-2,000 සමඟ සැසඳීමේදී ඉතා අඩු මට්ටමකි. තවද තායිලන්තය (1,531 කි.ග්‍රෑ./හෙක්.) සහ මැලේසියාව (1047 කි.ග්‍රෑ./හෙක්.) වැනි ප්‍රධාන පෙලේ තරඟකාරී රටවල් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රබර් අස්වනු අනුපාතය ඉතා පහළ මට්ටමක පවතී. මෙම අඩු අස්වනු අනුපාතයට හේතු වී

3.2 රූප සටහන
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක: රබර්
(1990 = 100)



ඇත්තේ නිර්දේශිත මට්ටමට පොහොර නොයෙදීම, වැසි ආවරණ භාවිතය අඩුවීම, ක්ෂේත්‍රයේ අඩු පැළ සිටවීම යථා පරිදි සිදු නොවීම සහ පුහුණු කිරි කපන්නන්ගේ හිඟයයි. ඉහත දක්වන ලද බොහොමයක් කරුණු රබර් වගා අංශයේ ඵලදයිතාව සහ ආදායම් මට්ටම සමඟ සෘජු සම්බන්ධතාවක් පෙන්වයි. පුහුණු කිරි කපන්නන්ගේ හිඟය රබර් කර්මාන්තය මුහුණ දී ඇති ඉතා විශාල ගැටළුවකි. කිරි කැපීම පුහුණු

3.3 සංඛ්‍යා සටහන
රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා

	අයිතමය	ඒකකය	2001	2002(අ)	2003(ආ)
1.	නිෂ්පාදනය	කි.ග්‍රෑ.දශලක්ෂ	86	91	92
2.	බිම් ප්‍රමාණය (ඇ)				
	වගාව යටතේ ඇති (ඇ)	හෙක්ටයාර් දහස්	157	157	129
	කිරි කැපීම යටතේ ඇති(ඇ)	හෙක්ටයාර් දහස්	132	125	101
3.	ඵලදාව	හෙක්ටයාරයකට කි.ග්‍රෑ	653	724	911
4.	පොහොර භාවිතය	මෙට්‍රික් ටොන් දහස්	9	7	8
5.	නැවත වගා කිරීම්(ඈ)	හෙක්ටයාර්	557	712	564
6.	අළුතින් වගා කිරීම(ඈ)	හෙක්ටයාර්	141	141	450
7.	මිල				
	අපනයන(නැවිස)	කි.ග්‍රෑ./රුපියල්	66.35	69.53	105.25
	කොළඹ(ආර්.ඇස්.ඇස්1)	කි.ග්‍රෑ./රුපියල්	54.70	68.76	102.50
8.	නිෂ්පාදන පිරිවැය (ඉ)	කි.ග්‍රෑ./රුපියල්	48.00	54.00	63.30
9.	අපනයන	කි.ග්‍රෑ.දශ ලක්ෂ	32	37	35
10.	දේශීය පරිභෝජනය	කි.ග්‍රෑ.දශ ලක්ෂ	54.4	54.4	56.8
11.	අපනයන ඉපැයුම්	රුපියල් දශ ලක්ෂ	2,129	2,552	3,718
		එ.ජ.ඩොලර් දශ ලක්ෂ	24	27	39
12.	එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඊ)		0.4	0.5	0.5

මූලයන් : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 2002 ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කරන ලදී
(ඈ) වගා කළ බිම් ප්‍රමාණය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුවය.
(ඉ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2003 දී පවත්වන ලද සමීක්ෂණයට අනුව 2002 දී නිෂ්පාදන පිරිවැය සංශෝධනය කරන ලදී
(ඊ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

ශ්‍රමය අවැසි වෘත්තියක් වුවද එම වෘත්තියට දක්වන අඩු පිළිගැනීම සහ සාපේක්ෂව අඩු වැටුපක් ලැබීම නිසා තරුණ පරම්පරාව කිරි කැපීම සඳහා යොමුවීමට මැලිකමක් දක්වයි. 2003 වසරේ අළුතින් රබර් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 450 ක් වූ අතර එය ඉකුත් වසර සමඟ සැසඳීමේදී තුන් ගුණයකටත් වඩා වැඩිවීමකි. පවතින ඉහළ මිල මට්ටම්, අලුතෙන් රබර් වගා කිරීම් දිරි ගැන්වූ අතර කාලය ඉක්මවා ගිය පරිණත රබර් ගස් ඉවත් කිරීමට එමගින් බාධා ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස රබර් නැවත වගාකිරීම හෙක්ටයාර 564 ක් දක්වා සියයට 20 කින් අඩුවිය. 2003 වසරේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව රබර් නැවත වගා කිරීම සහ අළුතෙන් වගාකිරීම සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 62 ක් සහ රුපියල් දශ ලක්ෂ 28 ක් මුදුහරින ලදී.

කර්මාන්ත අංශයේ රබර් පරිභෝජනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 57 දක්වා සියයට 4.4 කින් වැඩිවිය. මෙය 2003 වසරේ සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 62 ක් විය. මේ අතර, ස්වාභාවික රබර් ආනයනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 9 ක් වූ අතර එය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 85 ක වැඩිවීමකි. කෙසේ වෙතත්, අධික දේශීය ඉල්ලුම නිසා රබර් අපනයනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 35 ක් වූ අතර මෙය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 4 ක පහල බැසීමකි.

පොල්

2003 වසරේ පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 2,562 ක් දක්වා සියයට 7 කින් ඉහළ ගියේය. 2002 වසර පුරා පැවති හිතකර කාලගුණික තත්වයෙහි දිගුකාලීන බලපෑම හේතුකොටගෙන නිෂ්පාදනයෙහි වැඩි වර්ධනයක් පෙන්නුම් කළේ විශේෂයෙන් වසරේ දෙවන භාගයේදී ය. තවද, 2002 වසරේ පැවති ආකර්ශනීය පොල් මිල ගණන් නිසා පොහොර යෙදීම දිරිමත් වීමද මෙම ඉහළ යාමට හේතුවිය.

පොල් ඵලදාවේ වර්ධනයෙහි ඇති වූ වාසිදායක තත්වය, කපාපු පොල් නිෂ්පාදනයෙහි ගෙඩි සමානය ගෙඩි දශ ලක්ෂ 369 ක් දක්වා සියයට 50 කින් ඉහළයාම මගින් පිළිබිඹු විය. කෙසේ වෙතත් පොල්තෙල් නිෂ්පාදනයෙහි ගෙඩි සමානය, ගෙඩි දශ ලක්ෂ 110 ක් දක්වා සියයට 58 කින් පහත වැටුනු අතර, එය පසුගිය වසර 10 තුළ වාර්තා වූ අඩුම නිමැවුම් මට්ටම විය. ආනයනය කරනු ලබන ආහාරයට ගන්නා තෙල් වර්ග මත පනවා තිබූ අධිභාරය, 2002 සැප්තැම්බර් මාසයේදී ඉවත් කිරීමෙන් පසු, වෙළඳපොළ තුළ බහුල වූ ආනයනය කළ තෙල් සමග දේශීය තෙල් මෝල් කරුවන්ට තරහ කිරීමට අපහසුවීම පොල්තෙල් නිෂ්පාදනය පහත වැටීමට හේතු විය.

3.3 රූප සටහන
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක: පොල්
(1990 = 100)



පොල් මද ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන අපනයනයෙහි සැලකිය යුතු වර්ධනයක් වසර තුලදී දක්නට ලැබුනි. කොප්පරා අපනයනය සියයට 44 කින් ඉහළ ගිය අතර, ගෙඩි පොල් අපනයනය වසර තුළදි සියයට 42 කින් ඉහළ ගියේය. උකු කළ පොල්කිරි සහ පිටිකළ පොල්කිරි නිෂ්පාදනයෙහි ගෙඩි සමානය දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් (සියයට 93 කින්) ගෙඩි දශ ලක්ෂ 63 ක් දක්වා ඉහළ ගියේය.

කොළඹ වෙන්දේසියේදී කපාපු පොල් සඳහා ලැබුණු සාමාන්‍ය මිල මට්ටම් වසර පුරාම ඉහළ අගයකින් පැවතුනි. කපාපු පොල් කිලෝග්‍රෑම් 1 ක් සඳහා ලද සාමාන්‍ය දේශීය මිල රුපියල් 71.36 ක් දක්වා සියයට 20 කින් අඩු විය. මේ අතර, කපාපු පොල් සඳහා පැවති සාමාන්‍ය අපනයන මිල එක්සත් ජනපද ඩොලරයට අනුව ගණනය කිරීමේදී සියයට 22 කින් අඩු විය.

3.4 සංඛ්‍යා සටහන
පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා

	අයිතමය	ඒකකය	2001	2002(අ)	2003(ආ)
1.	නිෂ්පාදනය (ඇ)	ගෙඩි දශලක්ෂ	2,769	2,392	2,562
	කපාපු පොල්	ගෙඩි දශ ලක්ෂ(ඈ)	408	246	369
	පොල්තෙල්	ගෙඩි දශ ලක්ෂ(ඈ)	566	265	110
	කොප්පරා(ඉ)	ගෙඩි දශ ලක්ෂ(ඈ)	81	71	102
	පොල්ගෙඩි අපනයනය	ගෙඩි දශලක්ෂ	28	24	34
	දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ)	ගෙඩි දශ ලක්ෂ	1,786	1,815	1,834
	පොල් කිරි අපනයනය	ගෙඩි දශ ලක්ෂ	30	32	63
2.	මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	439	439	439
3.	නැවත වගාව/යට් වගාව(උ)	හෙක්ටයාර	867	953	1,226
4.	නව වගාව(උ)	හෙක්ටයාර	993	904	1,098
5.	පොහොර භාවිතය	මෙ.ටොදහස්	30	38	39
6.	නිෂ්පාදන පිරිවැය	ගෙඩිය/රුපියල්	3.65	3.85	4.10
7.	පොල් ගෙඩියක සිල්ලර මිල	ගෙඩිය/රුපියල්	10.50	14.87	13.40
8.	සාමාන්‍ය අපනයන මිල නැවිස. (උ)	ගෙඩිය/රුපියල්	7.05	12.06	9.98
9.	අපනයන ඉපැයුම්	රුපියල් දශ ලක්ෂ	7,348	8,009	8,926
		එජ.ඩොලර් දශ ලක්ෂ	82	84	93
	මද ආශ්‍රිත නිෂ්පාදන(උ)	රුපියල් දශ ලක්ෂ	3,639	3,957	4,601
		එජ.ඩොලර් දශ ලක්ෂ	41	41	48
	අනෙකුත් නිෂ්පාදන	රුපියල් දශ ලක්ෂ	3,709	4,052	4,325
		එජ.ඩොලර් දශ ලක්ෂ	42	42	45
10.	එකතු කළ වටිනාකම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්(එ)		2.0	2.0	2.0

මූලයන් : පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා නොග වෙනස්වීම් සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)

(ඈ) 1998 සඳහා ගෙඩි ප්‍රමාණය ගණනය බැලීමේදී යොදාගත් අනුපාතිකයන්

කපාපු පොල් මෙ.ටො.1	-	ගෙඩි 8,000
පොල්තෙල් මෙ.ටො.1	-	ගෙඩි 8,800 සහ
කොප්පරා මෙ.ටො.1	-	ගෙඩි 5,775
උකු කළ පොල් කිරි/ පිටිකල පොල් කිරි මෙ.ටො. 1	-	ගෙඩි 8,000

(ඉ) අපනයන පමණි.

(ඊ) ඒකපුද්ගල වාර්ෂික ගෘහ පරිභෝජනය පොල් ගෙඩි 94.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.

(උ) පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම්

(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන කුන සඳහා පමණි.

(එ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

අනෙකුත් අපනයන බෝග

සකස් නොකළ දුම්කොළ, පුවක්, කජුමද, වාණිජශීලී තෙල් වර්ග, විසිතුරු පැළ සහ මල් ආදී වෙනත් කෘෂිකාර්මික බෝගයන් සහ කුළුබඩු වලින් සමන්විත වන්නාවූ අනෙකුත් අපනයන බෝග අංශය, 2003 දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. බොහෝ ද්‍රව්‍ය සඳහා ලැබුණු අපනයන මිල පහත වැටීම මෙන්ම, සකස් නොකළ දුම්කොළ, ගම්මිරිස්, පුවක්, කොකෝවා මද සහ කජුමද වැනි ප්‍රධාන ද්‍රව්‍යවල අපනයන ප්‍රමාණයන් පහත වැටීමද හේතුකොටගෙන මෙම අංශයේ සමස්ත අපනයන ඉපැයීම් රුපියල් බිලියන 14.5 ක් දක්වා (රුපියල් මත ගණනය කිරීමේදී) සියයට 14 කින් පහත

වැටුනේය. කෙසේ වෙතත් මෙම අංශයේ සමස්ත අපනයන ඉපැයුම් ප්‍රමාණය, පසුගිය වසරේදී මෙන්ම රබර් සහ පොල් අපනයන මගින් ලැබූ මුළු අපනයන ආදායමට වඩා වැඩි අගයක් ගනු ලැබීය.

මෙම අංශයේ වඩාත් වැදගත් බෝගය වන්නේ කුරුඳු ය. කුරුඳු වගාවට අයත් මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් හෙක්ටයාර 25,300 ක් වේ. ශ්‍රී ලංකාව ලෝකයේ විශාලම කුරුඳු නිෂ්පාදකයා සහ අපනයනකරුවා වන අතර, එය සමස්ත ලෝක නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් ලෙස ගණන් බලා ඇත. කෘෂි අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 2003 දී කුරුඳු නිෂ්පාදනය සියයට 8 කින් ඉහළ ගොස් ඇතත්, පසුගිය වසර හා සැසඳීමේදී ගොවිපල මිල ගණන් සහ අපනයන මිල ගණන් ආන්තිකව පහත වැටී ඇත. මූලික ස්වරූපයෙන් අපනයනය කළ කුරුඳු වලින් ලද අපනයන ඉපැයීම් රුපියල් බිලියන 4.3 ක්වූ අතර, කුරුඳු පොතු තෙල් සහ කුරුඳු කොළ තෙල් අපනයනයෙන් ලද මුළු ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 244 ක් විය. මෑත වසරවලදී කුරුඳු අපනයනයෙන් ලද ඉපැයීම් සීග්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, 1998 සිට එය, තේ සහ පොල් අපනයනය හැරුනුකොට ඇති තුන්වන විශාලතම කෘෂි අපනයන බෝගය බවට පත්ව තිබේ.

මූලික ස්වරූපයෙන් සිදු කරනු ලබන අපනයනය වෙනුවට, එකතු කළ වටිනාකම් සහිත කුරුඳු අපනයනය ඉහළ නංවා ගැනීම පිණිස, සැලකිය යුතු විභවතාවයක් ශ්‍රී ලංකාවේ පවතී.

තාවකාලික ඇස්තමේන්තු වලට අනුව, පෙර වසරට සාපේක්ෂව ගම්මිරිස් නිෂ්පාදනයෙහි සැලකියයුතු වෙනසක් සිදුවී නැත. කෙසේ වෙතත් ගම්මිරිස් අපනයනය මෙට්‍රික් ටොන් 7,740 ක් දක්වා සියයට 2 කින් පහත වැටී ඇත. පසුගිය වසරට වඩා, අපනයන මිල ගණන්ද පහළ මට්ටමක වූ නිසා අපනයන ඉපැයීම් රුපියල් බිලියන 1.5 සිට රුපියල් බිලියන 1.2 දක්වා පහත වැටුණි.

කරාබු නැටි නිෂ්පාදනය, 2003 වර්ෂය තුලදී මෙට්‍රික් ටොන් 2,360 ක් දක්වා සියයට 42 කින් පහත වැටී ඇත. නිමැවුම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ, මැයි මාසයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ ඇතැම් කොටස්වලටත්, කළුතර, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්ක වලටත් බලපෑ අධික වැසි සහිත, අයහපත් කාලගුණික තත්වයයි. අඩු නිෂ්පාදනය මෙන්ම කරාබු නැටි සඳහා පහළ අපනයන මිලක් පැවතීමෙහිද ප්‍රතිඵලය වූයේ කරාබු නැටි වලින් ලැබූ අපනයන ඉපැයීම් සැලකිය යුතු ලෙස පහත වැටීමයි. කරාබු නැටි අපනයනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 2.5 ක් දක්වා සියයට 38 කින් පහත වැටුනු අතර, 2003 වර්ෂයේදී අපනයන ඉපැයීම්ද, 2002 දී ඉපැයූ රුපියල් බිලියන 2.7 සිට රුපියල් දශ ලක්ෂ 575 ක් දක්වා පහත වැටුනි.

2003 වර්ෂය තුළදී කජුමද නිෂ්පාදනය සියයට 29 කින් ඉහළ ගියේය. කජු වගා කිරීම, අලෙවිය සහ කජුමද සැකසුම් කර්මාන්තය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් ආධාර ලබාදීම හේතුකොටගෙන මෑත වසර කිහිපයේදී කජු වගාව සඳහා යොදගත් ඉඩම් ප්‍රමාණය සීග්‍රයෙන් ඉහළ ගියේය. ඒ අනුව, 2003 දී කජු වගාවට යොදගත් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 35,636 ක් විය. සංස්ථාව විසින් ආරම්භ කරනු ලැබූ බීජ කජු වගා ව්‍යාපෘතිය 2003 වසරේදීද තවදුරටත් ක්‍රියාත්මක විය. එලුවන්කුලම පිහිටුවා ඇති බීජ පැළ උයනට අතිරේකව, ප්‍රාදේශීය මට්ටමේ ගොවීන්ට උසස් මට්ටමේ බීජ පැළ ලබාදීමේ අරමුණින්, 2003 දී අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් විල්ලච්චිය ප්‍රදේශයේ බීජ පැළ උයනක් ස්ථාපනය කරන ලදී. පැළ සිටුවීමේ සහයෝගිතා වැඩසටහන්, ව්‍යාප්ති සේවා, පර්යේෂණ සහ වෙළෙඳපොළ වැඩසටහන් ආදිය ක්‍රියාත්මකවීම හේතුකොටගෙන අනාගතයේදී කජු

3.5 සංඛ්‍යා සටහන
අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනයන්

මෙට්‍රික් ටොන්

	2001	2002(අ)	2003(ආ)
කෝපි	2,350	2,360	3,090
කොකෝවා	1,275	1,100	1,100
කුරුඳු පොතු	13,600	13,000	14,015
ගම්මිරිස්	7,650	12,600	12,660
කරාබු නැටි	2,700	4,100	2,360
කරඳමුංගු	60	60	64
සාදික්කා සහ වසාවාසි	1,100	1,600	1,740
කජු	1,239	1,292	1,645

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා කජු සංස්ථාව

කර්මාන්තය තවදුරටත් වර්ධනය වනු ඇත.

විසිතුරු පැළ සහ මල් වගා කිරීමේ අංශය අපනයන ඉපැයීම් සඳහා 2003 වර්ෂයේදී සැලකියයුතු දායකත්වයක් සපයන ලදී. විසිතුරු පැළ, මුල් අද්දවන ලද දඬු සහ මල් අපනයනයෙන් ලැබූ අපනයන ඉපයීම් 2003 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 925 ක් දක්වා සියයට 17 කින් වැඩි විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සහ අපනයන සංවර්ධන මණ්ඩලයෙන් සැපයුනු සහයෝගය හේතුකොටගෙන මෙම අංශය, තම ක්‍රියාකාරිත්වය පුළුල් කරගනු ලැබීය. තාක්ෂණික ආධාර ලබාදීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, ජාතික උද්භිද උද්‍යානය හරහා පැළ ප්‍රභේද නිකුත් කිරීම ආදිය මගින් ආධාර කිරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ඉටු කරනු ලැබීය. අපනයන කරුවන්ට මෙන්ම, අපනයන ක්ෂේත්‍රයට ඇතුළුවීමට විභවතාවයක් ඇති අය සඳහා උපදේශක සේවා සැපයීම සහ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවීමට පහසුකම් සැපයීම මගින් අපනයන සංවර්ධන මණ්ඩලයද මල් වගා අංශයේ වර්ධනය සඳහා ආධාර කරනු ලැබීය.

සහනාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අවශ්‍ය යෙදවුම් හා තාක්ෂණික තොරතුරු ලබාදීම, කුළුබඩු වගා කිරීමට හා සකස් කිරීමට අදළ ව්‍යාපෘති සේවා සැපයීම ආදිය මගින්, අපනයන බෝග අංශයේ සංවර්ධනය උදෙසා, අපනයන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් විශාල කාර්යභාරයක් තවදුරටත් ඉටු කරනු ලැබීය. කෙසේ වෙතත්, අරමුදල් හිඟවීම හේතුකොටගෙන අපනයන කෘෂිකර්ම සහයෝගිතා වැඩසටහන යටතේ ලබාදුන් සහනාධාර, 2003 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 22.6 ක් දක්වා තවදුරටත් පහත වැටුනි. 2002 වර්ෂයේදී මෙන්ම, සහනාධාරවලින් සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමාණයක් ලබාදී තිබුනේ ගම්මිරිස් වගාව වෙනුවෙනි. සහභාගිත්ව වාණිජ බැංකු 8 ක් හරහා පලතුරු, කුළුබඩු සහ උද්‍යාන බෝග යන වගා අංශ සඳහා ණය පහසුකම් සම්පාදනය කිරීම මගින් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මත ක්‍රියාත්මක වන "දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය" පස්වන වසර ලෙස 2003 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. ඉහත ව්‍යාපෘතිය මගින් බීජ සහ පැළ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ගොවිපළ උපදේශක සේවා සැපයීම, අළෙවිකරණය සහ තාක්ෂණික සේවා සැපයීම ආදිය තුළින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහයවීම තවදුරටත් සිදු කරනු ලැබීය.

3.4 දේශීය කෘෂිකර්මය

වී

2000 වර්ෂයේදී වාර්තා වූ ඉහළම වී නිමැවුමද සියයට 7 කින් අභිබවා යමින්, 2003 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දහස් 3,071 ක් (බුසල් දශ ලක්ෂ 147) දක්වා ඉහළ ගිය අතර එය මෙතෙක් වාර්තා වූ ඉහළම වී නිෂ්පාදනයයි. හිතකර කාලගුණික තත්වය මෙන්ම සටන් විරාමය හේතුකොටගෙන උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති සාමකාමී වාතාවරණයද සමස්ත වර්ධනයට දායක විය. කන්න දෙකෙහිදීම වගාවට යොදගත් කුඹුරු ඉඩම් ප්‍රමාණය මෙන්ම අස්වනු නෙලාගත් කුඹුරු ඉඩම් ප්‍රමාණයද සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. මහ කන්නයෙහි වී නිමැවුම, මෙතෙක් මහ කන්නයක හොඳම නිමැවුම ලෙස වාර්තා වී තිබූ 2000 මහ කන්නයේ නිමැවුමටත් වඩා සියයට 6.4 කින් ඉහළ ගියේය. යල කන්නයේ නිමැවුමද, මෙතෙක් යල කන්නයක හොඳම නිමැවුම ලෙස වාර්තා වූ 1999 යල කන්නයේ නිමැවුම අභිබවා සියයට 4.6 ක වර්ධනයක් අත්කර ගනු ලැබීය. කන්න දෙකෙහිදීම ප්‍රමාණවත් වර්ෂාපතනයක් පැවතීම හේතුකොටගෙන ආන්නික ඉඩම්ද වගාවට යොදගනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික සාමාන්‍ය අස්වනු අනුපාතය අඛණ්ඩව පහත වැටුනි. සාමාන්‍ය අස්වනු අනුපාතය හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 3.8 ක් දක්වා සියයට 3 කින් පහළ ගියේය. 2001 වසරේ ලභා කරගත් ඉහළම අස්වනු අනුපාතය, වසර දෙකක්ම අඛණ්ඩව පහත වැටුණු නමුත්, කලාපයේ බොහෝ රටවල්වලට වඩා ශ්‍රී ලංකාවේ අස්වනු අනුපාතය ඉහළ මට්ටමක පවතී. එනමුදු ශ්‍රී ලංකාවේ වී අස්වනු අනුපාතය තවමත් ලභාකර ගතහැකි අස්වනු විභවතාවයට වඩා අඩු මට්ටමක පවතී.

වගා පිරිවැය ඉහළයාම සහ සුළු පරිමාණයන් වලින් නිෂ්පාදනය සිදු කිරීම නිසා ශ්‍රී ලංකාවේ වී ගොවීන්ගේ ශුද්ධ ආදායම ඉතා පහළ මට්ටමක පවතී. වගා ඒකක සීග්‍රයෙන් කුඩා වී යාම හේතුකොටගෙන, පරිමාණානුකූල ඵල නෙලා ගැනීමට නොහැකිවීම නිසා නිෂ්පාදන වියදම ඉහළ නැංවේ. පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීත්තර වී, යන්ත්‍රෝපකරණ සහ ශ්‍රමය ආදී යෙදවුම්වල මිල ගණන් ඉතා සීග්‍රයෙන් ඉහළ යමින් පවතී. මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 50කටත් වඩා වැඩි ප්‍රමාණයක් වැය වන්නේ ශ්‍රම පිරිවැය සඳහාය. එමෙන්ම, පැළ සිටුවීම සහ අස්වනු නෙලීම පවතින කාලවලදී ශ්‍රම හිඟයක්ද දැකිය හැක. සමස්ත පිරිවැයෙන් සියයට 12 සිට සියයට 15 දක්වා ප්‍රමාණයක් පොහොර සඳහා වැය වේ.

අස්වනු නෙලාගත් ඉඩම් ප්‍රමාණය ඉහළයාම හේතුකොටගෙන, අස්වනු අනුපාතය සියයට 5 කින් පහත වැටුනද, 2002/2003 මහ කන්නයේ වී නිමැවුම සියයට 7 කින් ඉහළ ගියේය. කෘෂිකාර්මික දිස්ත්‍රික්ක 27 අතුරින්, වියළි සහ මධ්‍ය දේශගුණික කලාපවලට අයත් දිස්ත්‍රික්ක 15 කම අස්වනු ඉහළ ගියේය. උතුරු පලාතට අයත් සියලුම දිස්ත්‍රික්කයන්හි නිමැවුම ඉහළ ගිය අතර, එය සමස්ත මහ අස්වැන්නෙන් සියයට 7 ක ප්‍රමාණයක් ලෙස වාර්තා වී ඇත. පසුගිය වසරේ මෙන්ම, අම්පාර, කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක සහ මහවැලි 'එච්' කලාපය යන ප්‍රධාන වී නිෂ්පාදන කලාපවලින් ලැබුණු අස්වනු ප්‍රමාණය මහ කන්නයේ සමස්ත අස්වැන්නෙන් අඩකටත් වඩා (සියයට 52) වැඩිය.

අස්වනු අනුපාතය ආන්නිකව පහත වැටුනද, යල කන්නයේ වී නිමැවුම සියයට 8 කින් ඉහළ ගියේය. අස්වනු නෙලාගනු ලැබූ බිම් ප්‍රමාණය පසුගිය යල කන්නයට වඩා සියයට 9 කින් පමණ වැඩිවිය. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි වී නිමැවුම සියයට 72 කින් වැඩි වූ අතර, සැලකිය යුතු මට්ටම කින් නිමැවුම වැඩි වූ අනෙකුත් ප්‍රදේශ වූයේ මහවැලි 'එච්' කලාපය (සියයට 38 කින්) , හම්බන්තොට, (සියයට 34 කින්) සහ ත්‍රිකුණාමලය (සියයට 24 කින්) යන ප්‍රදේශයන්ය. අම්පාර, පොළොන්නරුව සහ කුරුණෑගල යන වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක 3 හි නිමැවුම සමස්ත යල නිමැවුමෙන් අඩකට

3.4 රූප සටහන
වී නිෂ්පාදනය



විශේෂ සටහන 8

ශ්‍රී ලංකාවේ වී අස්වැන්න පවතින්නේ පහළ මට්ටමක ද ?

ශ්‍රී ලංකාවේ ඉඩම් ඒකකයක් සඳහා වූ අස්වනු ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පවතින බව සාමාන්‍ය පිළිගැනීමයි. වෙනත් රටවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ වී වගාව පහළ මට්ටමක පැවතීම නිසා වී වගාව අත්හැර දැමියයුතු බවටද සමහරු උපදෙස් දෙනු ලැබේ. කෙසේ වෙතත්, කලාපයේ අනෙකුත් රටවල් සමග සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ වී වගාවෙහි සාමාන්‍ය අස්වනු මට්ටම, එකී බොහෝ රටවලට වඩා ඉතා ඉහළ මට්ටමක පවතී. උදාහරණ වශයෙන් තායිලන්තය, මියන්මාරය සහ පාකිස්ථානය වැනි සහල් අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල්වලට වඩා ශ්‍රී ලංකාවේ අස්වනු මට්ටම ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ වී අස්වනු මට්ටම් ජපානයේ හෝ කොරියාවේ අස්වනු මට්ටම් සමග සැසඳිය නොහැකි වන්නේ එම රටවල සමශීතෝෂ්ණ දේශගුණය මෙන්ම, දිගු දහවල් කාල පැවතීමෙන් සිදුවන වැඩි ප්‍රභා සංස්ලේෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස අස්වනු මට්ටම ඉහළ යාමයි.

ඖර්ම කලාපයේ වී නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල වී අස්වනු අනුපාත (කි.ග්‍රෑ./හෙක්ටයාරයකට)

රට	1999	2000	2001	2002
ඉන්දියාව	3,236.1	2,852.3	2,131.5	2,839.5
ඉන්දුනීසියාව*	4,251.9	4,400.7	4,387.9	4,473.2
මැඩගස්කරය	2,128.4	2,050.8	2,195.2	2,196.2
මියන්මාරය	3,240.5	3,383.4	3,417.4	3,674.2
පාකිස්ථානය	3,074.4	3,031.2	2,754.2	3,017.9
පිලිපීනය	2,946.8	3,068.1	3,186.6	3,279.7
ශ්‍රී ලංකාව	3,672.0	3,856.4	3,954.3	3,895.2
තායිලන්තය	2,424.5	2,612.8	2,618.6	2,564.1

මූලය : ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය / ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

* ඉන්දුනීසියාවේ සමහර ප්‍රදේශ සමශීතෝෂ්ණ දේශගුණික කලාපවලට අයත්වන අතර දිගු දිවාකාලයක් පැවතීම නිසා වැඩි අස්වනු ප්‍රමාණයක් ලැබේ. තවද, ගිනිකඳුවල ක්‍රියාකාරිත්වය නිසා ඉන්දුනීසියානු පසෙහි සරු භාවයත් වැඩිය.

(සියයට 49) ආසන්න ප්‍රමාණයක් බවට ගණනය කර ඇත. අඛණ්ඩ 10 වෙනි වසරටත්, අම්පාර දිස්ත්‍රික්කයෙන් ඉහළම නිමැවුම වාර්තා වූ අතර, එය සමස්ත යල නිමැවුමෙන් පහෙන් එකකට ආසන්න (සියයට 19) වේ.

අස්වනු නෙලන කාලවලදී, විශේෂයෙන් ගොවිපළ වී මිල ගණන් පහත වැටුනි. නියම නිෂ්පාදනයට වඩා වැඩි, අතිශයෝක්තියෙන් ඉහළ නැංවූ නිෂ්පාදන මට්ටමක් වාර්තා වී ඇති බවට තොරතුරු පැතිරී යාම වී මිල ගණන් කෙරෙහි ඉතා අහිතකර බලපෑමක් ඇතිකරනු ලැබේ. එමනිසා අනාගත වී නිෂ්පාදනය පිළිබඳ පුරෝකථනයන් ප්‍රකාශයට පත් කිරීමේදී, එමගින් ගොවිපළ මිල ගණන් මත ඇතිවන බලපෑම සැලකිල්ලට ගතයුතුව ඇත. ගොවිපළ මිල ඉහළ මට්ටමක පවත්වා ගැනීමට දිරි දීමක් වශයෙන්, සහල් ආනයනය මත රජය විසින් පනවා තිබූ කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 5 ක්වූ විශේෂ ආනයන බද්ද, 2003 මාර්තු 5 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 7 ක් දක්වා ඉහළ නංවනු ලැබීය. ඉන්පසුව, යල කන්නයේ නිමැවුම සැලකිල්ලට ගෙන, 2003 අගෝස්තු 19 සිට ක්‍රියාත්මක වන පරිදි මෙම බද්ද සහල් කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 9 ක් දක්වා තවදුරටත් වැඩි කරනු ලැබීය. බිත්තර වී අවශ්‍යතාවයන් සහ පසු අස්වනු නාස්ති සඳහා ගැලපීමෙන් පසු වර්ෂයේ සමස්ත වී නිෂ්පාදනය, දේශීය සහල් අවශ්‍යතාවයෙන් සියයට 98 ක් බවට ගණනය කර ඇත. ඉතිරි ප්‍රමාණය ආනයනය කෙරුනු

3.6 සංඛ්‍යා සටහන
වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා

අයිතමය	ඒකකය	2002(අ)			2003(ආ)		
		මහ	යල	එකතුව	මහ	යල	එකතුව
දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	510	342	852	602	381	983
අස්වැන්න කපාගන්නා ලද බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	499	321	820	560	352	911
අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	444	290	734	499	317	817
නිෂ්පාදනය	මෙ.ටො.දහස්	1,774	1,086	2,860	1,895	1,177	3,071
	බුසල් දහස්	85,002	52,027	137,029	90,785	56,372	147,157
ඵලදාව (ඇ)	හෙක්ටයාරයකට කි.ග්‍රෑ.	3,990	3,742	3,895	3,794	3,709	3,761
දෙන ලද ණය ප්‍රමාණය	රුපියල් දහස්	234	315	549	445	493	938
සහල් ආනයනය	මෙ.ටො.දහස්	-	-	95	-	-	35
(වී සමානය)	(මෙ.ටො.දහස්)						
		-	-	140	-	-	51

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සම්මුඛසාකච්ඡාවලින් ලබාගත් දත්තයන් පදනම් කොටගත් ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අතර, 2002 වර්ෂයේ ආනයනය කරනු ලැබූ සහල් මෙට්‍රික් ටොන 95,000 සමග සසඳන කල 2003 වර්ෂය තුළදී ආනයනය කොට ඇති මුළු සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 35,000 ක් විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බෝඹුවෙල සහ අම්බලන්තොට බීජ අභිජනන මධ්‍යස්ථාන මගින් වසර තුළදී, උසස් අස්වනු ලබාදෙන අළුත් බීජ ප්‍රභේද 2 ක් නිකුත් කරනු ලැබූ අතර, එය අනාගත වී අස්වනු අනුපාතය ඉහළයාමට ඉවහල් වනු ඇත.

අනෙකුත් ක්ෂේත්‍ර බෝග

අර්තාපල් සහ ලොකු එෑණු හැරුනු කොට රනිල බෝග, ධාන්‍ය බෝග, අලවර්ග සහ වෙනත් බෝග අයත් වන අනෙකුත් ක්ෂේත්‍ර බෝග අංශයෙහි ක්‍රියාකාරිත්වය, 2003 වර්ෂයේදී පෙර වසරට වඩා හොඳ මට්ටමක පැවතිනි. සෝයා බෝංචි නිෂ්පාදනය දෙවන වසරටත් නොකඩවා වැඩි වූ අතර, එය පෙර වසරේ වාර්තා වූ නිෂ්පාදනයට වඩා දෙගුණයකටත් වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. නිෂ්පාදනය ඉහළ යාමට බලපෑ ප්‍රධාන හේතූන් වූයේ ඵලදායිතාවය වැඩිවීම සහ වපසරිය වැඩි වීමය. නිෂ්පාදනය වැඩිවූ අනෙකුත් රනිල බෝගයන් වූයේ කව්පි (සියයට 39), උඳු (සියයට 17) සහ මුං ඇට (සියයට 10) ය. කව්පි සහ මුං ඇට නිමැවුම ඉහළයාම කෙරෙහි මූලික වූයේ වපසරිය වැඩි වීමයි. උඳු නිෂ්පාදනය ඉහළයාමට ඵලදායිතාවය වැඩිවීම සහ වපසරිය වැඩිවීම යන කරුණු 2 ම හේතුවිය.

2003 වසරේ මිරිස් නිෂ්පාදනය 2002 මට්ටමෙහිම පැවතිනි. කෙසේ වෙතත් පසුගිය දසවසර තුලදී, මිරිස් නිෂ්පාදනයෙහි පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කල අතර, වර්තමානයෙහි නිෂ්පාදන මට්ටම, 1990 දශකයේ මුල් වසරවල වාර්තා වූ නිෂ්පාදනයෙන් තුනෙන් එකක් පමණ වේ. මෙම පසුබැසීමට ප්‍රධාන හේතුව වූයේ, ආනයනය කරනු ලබන වියලි මිරිස් සමග තරහ කිරීමට නිෂ්පාදකයින්ට නොහැකි වීමයි. යෙදවුම් මිල සීඝ්‍ර ලෙස ඉහළ යාමත්, ඵලදායිතාව අඩු මට්ටමක පැවතීමත් නිසා මිරිස්වල නිෂ්පාදන වියදම ඉහළ ගියේය. දේශීය මිරිස් ගොවීන් ආරක්ෂා කිරීමේ අරමුණින්, ආනයනය කරනු ලබන මිරිස් සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 30 ක විශේෂිතවූ බද්දක්, 2002 මාර්තු මාසයේදී පනවන ලදී. මෙම විශේෂිත වූ බද්ද 2003 වසරේදීද ඵලෙසම ක්‍රියාත්මක කරන ලදී.

1998 වර්ෂයේ සිට නොකඩවා වැඩිවීමක් පෙන්නුම් කල අර්තාපල් නිෂ්පාදනය 2003 වර්ෂයේදී සියයට 19 කින් පහත වැටුනි. මෙයට හේතු වූයේ ඵලදායිතාවය අඩුවීම සහ වපසරිය අඩුවීමයි. අර්තාපල් වගාව වෙනුවෙන් දෙන ලද අධි ආරක්ෂණය හේතුවෙන්, අර්තාපල් වගා කිරීම ලාභදායී වූ බැවින්, සමහර ගොවීන්, නිර්දේශ කරඇති පරිදි බෝග මාරු කිරීම සිදු නොකර එකම බිම තුළ නොකඩවා අර්තාපල් වගා කරන ලදී. නොකඩවා එකම භූමියේ අර්තාපල් වගා කළවිට, පසේ හට ගන්නා පළිබෝධ වැඩිවන අතර, එය ඵලදායිතාවය අඩුවීමට හේතු වේ.

රතුඵෑණු නිෂ්පාදනය සියයට එකක වැඩිවීමක් පෙන්නුම් කල අතර, ලොකු එෑණු නිෂ්පාදනය සියයට 2 කින් පහත වැටුනි.

දේශීය නිෂ්පාදනයේ පහත වැටීම හේතුකොට ගෙන අර්තාපල් සහ වියලි මිරිස් ආනයනය පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 10 කින් වැඩිවිය.

ඵලවළු සහ පලතුරු

2003 වසරේ සමස්ත ඵලවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 552,000 ක් දක්වා සියයට 2 කින් වැඩිවිය. උඩරට සහ

පහතරට දෙඅංශයේම එළවළු නිෂ්පාදනයේ වැඩිවීමක් පෙන්නුම් කෙරේ. වසර තුළදී එළවළු වගාවට යොදා ගැනුණු බිම් ප්‍රමාණය සියයට 3 කින් ඉහළ ගියේය. මෙය 2002/03 මහ කන්නයේ එළවළු වගා කරන ලද වපසරියේ සියයට 6 ක වැඩිවීමෙත්, 2003 යල කන්නයේ වපසරියේ සියයට 2 ක අඩුවීමෙත් සමස්ත ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් එළවළු නිෂ්පාදනය වැඩිවීමක් පෙන්නුම් කළද එළවළු මිල ගණන් වලද වැඩිවීමක් දක්නට ලැබුණි. සමස්ත එළවළු නිෂ්පාදනයෙන් වැඩි ප්‍රතිශතයක් දේශීයව පරිභෝජනය කරන අතර අපනයනය කරන්නේ දේශීය එළවළු නිෂ්පාදනයෙන් සියයට එකකටත් වඩා අඩු ප්‍රමාණයකි.

2003 වසරේ සමස්ත පලතුරු නිෂ්පාදනයේ වර්ධනයක් දක්නට ලැබිණි. ඉකුත් වසරට සාපේක්ෂව කෙසෙල්, අඹ සහ පැපොල් නිෂ්පාදනය වැඩිවූ අතර අන්නාසි නිෂ්පාදනයේ අඩුවීමක් දක්නට ලැබිණි. කෙසේ වෙතත් සංචාරක අංශය යථා තත්වයට පත්වීමෙන් ඇතිවූ අධික ඉල්ලුම නිසා පලතුරු මිල ගණන් ඉහළ මට්ටමක පැවතුනි. 2003 වසර තුළදී රුපියල් බිලියන 1.8 ක වටිනාකමින් යුත් අළුත් සහ වියළි පලතුරු මෙට්‍රික් ටොන් 52,600 කට අධික ප්‍රමාණයක් ආනයනය කරන ලදී. 2003 වසරේ ඇපල් ආනයන ප්‍රමාණය සමස්ත පලතුරු ආනයන ප්‍රමාණයෙන් සියයට 43 ක් විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2003 වසරේදී පලතුරු, එළවළු, පලාවර්ග, අලවර්ග සහ කුළුබඩු බෝගවල ඉහළ අස්වනු ලබාදෙන නව ප්‍රභේද ගණනාවක් නිකුත් කරන ලද අතර ආරක්ෂිත කෘෂි තාක්ෂණය සහ පසු අස්වනු සැකසීම් පිළිබඳව පුහුණු වැඩ සටහන් ගණනාවක් පවත්වන ලදී. පසු අස්වනු තාක්ෂණික මධ්‍යස්ථානය එළවළු හා පලතුරු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් පෙට්ටි හඳුන්වා දෙන ලද අතර එම ආයතනයේ නැවුම් නිෂ්පාදන දාම (Fresh Produce Chain) ව්‍යාපෘතිය යටතේ කැප්පෙටිපොල, මහවැලි ' ජී' සහ 'එච්' කලාපවල එළවළු හා පලතුරු මිලදී ගන්නන්ට ප්ලාස්ටික් පෙට්ටි ලබාදුන් අතර එමගින් කොළඹ තොග වෙළඳපොළට සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට අවම පසු අස්වනු හානියකින් යුතුව ප්‍රවාහනය කිරීමට හැකියාව ලැබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ප්ලාස්ටික් පෙට්ටි 5,836 ක් එළවළු හා පලතුරු එකතු කරන්නන් විසින් මිලදී ගෙන ඇති අතර නැවුම් නිෂ්පාදන දම ගණනාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. පසු අස්වනු ක්‍රියාකාරකම් තවදුරටත් නඟා සිටුවීම සඳහා පසු අස්වනු තාක්ෂණික ආයතනය විවිධ පර්යේෂණ වල නියැලෙමින් සිටී. තවද මෙම ආයතනය, පසු අස්වනු හානි වැලැක්වීම සහ එකතු කළ අගය සහිත කෘෂි සැකසීම් මධ්‍යස්ථාන පිළිබඳව නිෂ්පාදකයන්, සැකසුම්කරුවන්, වෙළෙඳුන් සහ ව්‍යාජ්ති නිලධාරීන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. 2003 වසර තුලදී රුපියල් දශ ලක්ෂ 679 ක වටිනාකමකින් යුත් එළවළු කිලෝග්‍රෑම් දශ ලක්ෂ 9.4 ක ට අධික ප්‍රමාණයක් සහ රුපියල් දශ ලක්ෂ 605 ක වටිනාකමකින් යුත් අළුත් හා වියලි පලතුරු කිලෝග්‍රෑම් දශ ලක්ෂ 7.7 ක ප්‍රමාණයක් අපනයනය කරනු ලැබීය. මීට අමතරව වටිනාකම රුපියල් දශ ලක්ෂ 801 ක් වූ සකස් කල එළවළු සහ පලතුරු කිලෝග්‍රෑම් දශ ලක්ෂ 7.6 ක ප්‍රමාණයක්ද අපනයනය කරන ලදී. පලතුරු වර්ග විශාල ප්‍රමාණයක් අපනයනය කලද, අන්නාසි හැරුන විට වාණිජ මට්ටමේ අපනයන මූලික පලතුරු වගාවන් පවතින්නේ ඉතා සුළු සංඛ්‍යාවකි. පටක රෝපන ක්‍රම භාවිතා කරමින් පාලිත පරිසර තත්ව යටතේ වගාකිරීම තුළින් වැඩි ඵලදාවක් ලබා ගැනීමට මෙන්ම ඉහළ ගුණාත්මයෙන් යුත් ඵලදාවක් ලබා ගැනීමටද හැකියාවක් ලැබෙනු ඇත.

සීනි

සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල කොටස් පිළිවෙලින් සියයට 90 ක් සහ සියයට 53 ක් පුද්ගලික අංශයට පවරා දෙමින් 2002 වසරේ ඇරඹී පුද්ගලිකකරණ ක්‍රියාවලියේ ධනාත්මක ප්‍රතිඵල පෙන්වමින් 2003 වසරේදී උක්ත සීනි කර්මාන්තශාලා දෙකේම නිෂ්පාදනය වැඩි වී ඇත. ඒ අනුව 2003 වසරේ සීනි නිෂ්පාදනය, ඉකුත් වසර තුනක කාලයක් තිස්සේ පැවති අඩු නිෂ්පාදන මට්ටම් අභිබවා යමින් ඉකුත් වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 54,365 ක් දක්වා සියයට 45 කින් වැඩිවිය. පැල්වත්ත කම්හලෙහි සීනි නිමවුම සියයට 57 කින් ඉහළ ගිය අතර සෙවනගල කම්හලෙහි සීනි නිමවුම සියයට 24 කින් ඉහළ ගියේය. මෙම කම්හල්වල සීනි ලබා ගැනීමේ අනුපාත පහළ වැටී ඇති බැවින් සීනි නිමවුම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කම්හල් දෙකෙහිම අඹරන ලද උක්දඬු ප්‍රමාණය ඉහළ යාමයි. 2003 වසර තුළදී පැල්වත්ත කම්හලෙහි අඹරන ලද මුළු උක් දඬු ප්‍රමාණය සියයට 67 න් ඉහළ ගියේය. පැල්වත්ත සමාගම සතු වගාව තුළින් ලැබූ උක්දඬු ප්‍රමාණය මෙන්ම පෞද්ගලික උක්දඬු මිලදී ගැනීම් වැඩිවීම මෙම සමස්ත වැඩිවීමට හේතුවිය. සෙවනගල කම්හලෙහි අඹරන ලද උක්දඬු ප්‍රමාණය සියයට 20 කින් ඉහළ ගියේය. දේශීය සීනි නිෂ්පාදනය ජාතික සීනි අවශ්‍යතාවයෙන් සියයට 15 කටත් වඩා අඩු මට්ටමක පවතී.

වාණිජ මට්ටමෙන් උක් වගා කිරීම ඇරඹී දශක ගණනාවක් ගතවී ඇතද, සීනි කර්මාන්තය ව්‍යුහාත්මක ගැටළු රාශියකට මුහුණ දෙමින් සිටී. අඩු අස්වැන්න, සීනි ලබා

3.5 රූප සටහන
සීනි සැපයුම



3.7 සංඛ්‍යා සටහන
සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා

අයිතමය	ඒකකය	සෙවනගල සීනි කම්හල		පැල්වත්ත සීනි කම්හල		එකතුව	
		2002(අ)	2003(ආ)	2002(අ)	2003(ආ)	2002අ	2003(ආ)
1. උක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය (නිරීක්ෂාව ඇතුළුව) (ඇ)	හෙක්ටයාර	3,885	3,500	3,988	5,060	7,873	8,560
2. උක්දඬු ප්‍රමාණය(ඇ)	හෙක්ටයාර	2,798	2,798	3,105	3,377	5,903	6,175
3. කපාගත් උක්දඬු ප්‍රමාණය(ඇ)	මෙට්‍රික් ටොන් දහස්	151	196	104	212	255	407
4. පෞද්ගලික අංශයෙන් මිලට ගත් උක්දඬු ප්‍රමාණය	මෙට්‍රික් ටොන් දහස්	0	0	163	234	163	234
5. අඹරන ලද උක්දඬු ප්‍රමාණය	මෙට්‍රික් ටොන් දහස්	163	196	267	445	430	641
6. සාමාන්‍ය ඵලදාව (ඇ)	හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන්	54	70	38	63	43	66
7. නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය(අපතේ යන සීනි හැර)	මෙට්‍රික් ටොන් දහස්	14	16	24	37	38	54
8. සීනි ලබාගැනීමේ ප්‍රතිශතය(ඈ)	%	8.40	8.29	8.94	8.39	8.77	8.36

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන්ද ඇතුළත් වේ.

(ඈ) සීනි ලබාගැනීමේ ප්‍රතිශතය = $\frac{\text{නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය}}{\text{අඹරන ලද උක්දඬු ප්‍රමාණය}}$ x 100

මූලයන් : සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනය
සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය

ගැනීමේ අනුපාත අඩු මට්ටමක පැවතීම සහ කම්කරු ගැටළු මේ අතර ප්‍රධාන තැනක් ගනී. තවද, අන්තර්ජාතික වෙළඳපොළේ සීනි මිල ගණන් අඩුවීම ද දේශීය සීනි කර්මාන්තයට අහිතකර බලපෑම් ඇතිකරනු ලබයි. එමනිසා, සීනි නිෂ්පාදනය තුළින් පමණක් ලාභ ලැබීමට නොහැකි බැවින්, කර්මාන්තයේ පැවැත්ම සඳහා සීනි නිපදවන අතරම ඉහළ ගුණාත්මයෙන් යුත් මධ්‍යසාර සහ වෙනත් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා ආයෝජනය කළ යුතුව ඇත.

වාණිජ වශයෙන් වගාකිරීම සඳහා උක් පර්යේෂණ ආයතනය 2003 වසරේදී නව ප්‍රභේද 2 ක් නිර්දේශ කරන ලදී.

3.5 ධීවර සහ පශු සම්පත්

ධීවර

2003 වසරේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 234,960 ක්වූ අතර, එය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 5.4 ක අඩුවීමකි. සමස්ත නිෂ්පාදනයෙන් සියයට 89 කට දායක වන

3.8 සංඛ්‍යා සටහන
මත්ස්‍ය නිෂ්පාදනය

මෙට්‍රික් ටොන් දහස්

අනු අංශ	2001	2002(අ)	2003(ආ)
මුහුදු මත්ස්‍ය(ඇ)	255	273	255
ජලජීවී	30	28	30
එකතුව	285	301	285

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ හා ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලයන් : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ජාතික ජලසම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

සාගර ධීවර අංශයේ නිමැවුම සියයට 7 කින් පහත වැටුණි. මීට ප්‍රතිවිරුද්ධව යමින් මිරිදිය සහ ජලජීවී ධීවර අංශයේ නිමැවුම මෙට්‍රික් ටොන් 30,280 ක් දක්වා සියයට 7.6 කින් ඉහළ ගියේය.

මුහුදු ධීවර අංශයේ නිෂ්පාදනය පහත වැටීමට හේතු වූයේ, ධීවර කර්මාන්තයේදී යොදු ගනු ලබන සමහර මෙවලම් භාවිතා කිරීම සඳහා රජය විසින් නව නීති පැනවීමයි. කෙසේ වුවද, මෙම ප්‍රතිපත්තියෙහි අහිතකර බලපෑම තාවකාලික සංසිද්ධියක් වන අතර, මෙම නීති මගින් සාගර සම්පත් අනිසි ලෙස උපයෝජනය කිරීම අඩු කිරීම තුළින් දිගුකාලීන තිරසාර බව සහතික කෙරේ. තවද දකුණු සහ නිරිතදිග වෙරළ තීරයේ 2003 මැයි සහ ජුනි මාසවල පැවති අහිතකර කාලගුණික තත්වය නිසා මසුන් මැරීම සඳහා යාහැකි දින සංඛ්‍යාව අඩුවීමද, මුහුදු ධීවර අංශයේ නිෂ්පාදනය අඩුවීමට හේතු විය. කෙසේ වෙතත් ධීවර කර්මාන්තයේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම පිණිස දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කිරීමට සමත් වන සේ ධීවර අංශයේ දනට පවතින නීති සහ රෙගුලාසි සංශෝධනය කළ යුතුව ඇත. මිරිදිය සහ ජලජීවී ධීවර අංශයෙහි නිෂ්පාදනය ඉහළ යාමට හේතුවූයේ මිරිදිය ජලාශවල ඇහිල්ලන් බෝ කිරීම හා රැස් කිරීම ඉහළ යාමයි.

2003 වසරේ අලුත් සහ අධි ශීත කරන ලද මත්ස්‍ය අපනයනය මෙට්‍රික් ටොන් 14,714 ක් දක්වා සියයට 13.3 කින් ඉහළ ගියේය. ක්‍රස්ටේශියාවෙන් අපනයනය මෙට්‍රික් ටොන් 6,741 ක් දක්වා සියයට 31කින් ඉහළ ගිය අතර, එය මුළු මත්ස්‍ය අපනයනයෙන් සියයට 45 ක් විය. මත්ස්‍ය අපනයනයෙන් ලැබූ ඉපයීම් රුපියල් දශ ලක්ෂ 8,953 ක් වූ

අතර, මෙය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 20 ක වැඩි වීමකි. වසර තුළදී, විසිතුරු මසුන් අපනයනයෙන් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 623 ක් දක්වා සියයට 18 කින් වැඩි විය.

2003 වසර තුළ සිදු වූ වැදගත් සංසිද්ධියක් ලෙස යෝජිත, මසුන් ටින් කිරීමේ කර්මාන්ත ශාලාව දැක්විය හැක. මෙය ලංකා ධීවර සංස්ථාව යටතේ ඇති යුනියන් පිෂ් ප්‍රොඩක්ට් සමාගම (Union Fish Product Ltd) සහ රුසියාවේ ඉන්ෆෝම් ප්‍රොග්‍රේස් බැංකුව (Inform Progress Bank) අතර හවුල් ගිවිසුමකි. මෙය, ධීවර අංශයේ දිගු කාලයක් මුළුල්ලේ සිට පැවති අවශ්‍යතාවයක් ඉටු වීමක් ලෙස දැක්විය හැක. ඇස්තමේන්තුවලට අනුව යෝජිත කර්මාන්තශාලාව, දේශීය සහ අපනයන වෙළෙඳපොළ අරමුණු කරගෙන දිනකට ටින් කළ මාලු ටොන් 215 ක් නිෂ්පාදනය කරනු ඇත. තවද, දේශීය ධීවර කර්මාන්තය, නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන විදේශීය ධීවර යාත්‍රාවලින් ආරක්ෂා කර ගැනීම සඳහා නවීන යාත්‍රා, ශීත ගබඩා පහසුකම් මෙන්ම සාගර සම්පත් වඩා හොඳින් භාවිතා කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු කිරීම් ආදිය අත්‍යවශ්‍ය වන අතර, ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සඳහා උනන්දු කරවීම තුලින් දිවයින වටා පිහිටි සාගර සම්පත් වලින් උපරිම වාසි සහගත තත්වයක්ද ලබාගත හැකි වනු ඇත.

පශු සම්පත්

ප්‍රධාන වශයෙන් කිරි පට්ටි පාලනය සහ කුකුළු පාලනය යන උප අංශ දෙකෙන් සමන්විත පශු සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය ඉකුත් වසරට සාපේක්ෂව 2003 වසරේ සතුටුදායක මට්ටමක පවැතින. පවතින ඇස්තමේන්තුවලට අනුව එළකිරි නිෂ්පාදනය ලීටර දශ ලක්ෂ 156 දක්වා සියයට 2 කින් වර්ධනය වී ඇත. මීට ප්‍රතිවිරුද්ධව යමින් මී කිරි නිෂ්පාදනය ලීටර දශ ලක්ෂ 30 ක් දක්වා ආන්තිකව (සියයට 0.4) පහළ වැටුනි. කිරි සඳහා ගොවිපොළ මිල ලීටරයකට රුපියල් 15 ක මට්ටමේ නොවෙනස්ව පැවතිණ. කෙසේ වෙතත් සත්ව ආහාරවල මිල ඉහළයාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ ගියේය.

වර්තමානයේ දේශීය කිරි නිෂ්පාදිතය ප්‍රමාණවත් වන්නේ ජාතික අවශ්‍යතාවයෙන් සියයට 15 ක් සැපිරීම සඳහා පමණි. ඉතිරිය කිරි පිටි ආකාරයෙන් ආනයනය කරනු ලබයි. වසර තුළදී කිරි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මෙට්‍රික් ටොන් 67,941 ක් ආනයනය කර ඇති අතර ඒ සඳහා ආනයන වියදම රුපියල් බිලියන 11.5 ක් විය.

2003 වසරේ කුකුළු මස් නිෂ්පාදනය සියයට 3.6 කින් ඉහළ ගිය අතර බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 884.8 දක්වා ආන්තිකව පහළ වැටුනි. සත්ව ආහාරවල අධික මිල, ශීත ගබඩා කාමර වැනි යටිතල පහසුකම් නොමැතිවීම නිෂ්පාදකයන්ගේ ලාභාන්තිකය අඩුකරලීමට හේතුවිය. වර්ෂය තුළ කුකුළු පැටවුන් නිෂ්පාදනය දශ ලක්ෂ 74 ක් වූ අතර එය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 5.3 ක වැඩිවීමකි.

සත්ව ආහාරවල අධික මිල පශු සම්පත් අංශය නහා සිටුවීමට ඇති ප්‍රධානතම බාධකයක්ව පවතී. 2003 වසරේදී සත්ව ආහාරවල මිල ඉකුත් වසරට සාපේක්ෂව සියයට 10කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. වර්තමානයේ සත්ව ආහාර නිෂ්පාදනය සිදු කරනු ලබන්නේ මිල අධික ආනයනික අමු ද්‍රව්‍ය භාවිතයෙනි. සත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තවල දේශීය අමු ද්‍රව්‍ය භාවිතය දිරි ගැන්වීම තුළින් සත්ව ආහාරවල මිල ඉහළයාම අවම කර ගත හැක.

ගුණාත්මයෙන් යුත් සතුන්ගේ හිඟකම කිරිපට්ටි පාලනය පුළුල් කිරීමට ඇති බාධාවක් ලෙස හඳුනාගෙන ඇත. දැනට සිටින සත්ව ගහනය කෘතිම සිංචනය කිරීම මගින් වැඩිදියුණු කිරීම මේ වනවිට කරගෙන යනු ලබන ප්‍රධාන වැඩ පිළිවෙලවල් අතුරින් එකකි.

3.6 යෙදවුම්

3.6 රූප සටහන
ප්‍රධාන භෝග වර්ගවල පොහොර යෙදවුම්
(1990 = 100)



පොහොර

2003 වසරේ පොහොර නිකුතුව මෙට්‍රික් ටොන් 592,000 ක් වූ අතර එය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 10 ක අඩුවීමකි. මේ සඳහා වැඩි වශයෙන්ම හේතුවූයේ තේ සහ වී වගා අංශ සඳහා පොහොර නිකුතුව අඩුවීමයි.

2002 වර්ෂයේ ඔක්තෝබර් මස සංශෝධිත පොහොර සහනාධාර ක්‍රියාත්මක කිරීම සමගම ලෝක වෙළඳපොළේ පොහොර මිල වැඩිවීම හේතුවෙන් දේශීය පොහොර මිල ඉහළයාම 2003 වසරේ පොහොර භාවිතය සඳහා අහිතකර බලපෑම් ඇති කළේය. වී වගා අංශය සඳහා පොහොර නිකුතුව 2002 වසරට සාපේක්ෂව සියයට 18 න් අඩුවිය. 2003 වසර අග භාගයේ පැවති නියහය නිසා 2003/04 මහ කන්නයේ වී වගා කරන ලද භූමි ප්‍රමාණය අඩුවීම වී වගා අංශයේ පොහොර භාවිතය අඩුවීමට හේතුවිය. 2003 වසරේ තේ වගා අංශය සඳහා පොහොර නිකුතුව ඉකුත් වසරට සාපේක්ෂව සියයට 7 න් අඩුවිය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2003 වසර මුල් භාගයේ පැවති ඉරාක යුද්ධය නිසා කොළඹ වෙන්දේසියේ තේ මිල ගණන් අඩුවීමයි. කෙසේ වෙතත් පොල් සහ රබර් වලට වසර පුරාම පැවති ආකර්ෂණීය මිල ගණන්

3.9 සංඛ්‍යා සටහන
බෝග අනුව පොහොර භාවිතය

මෙට්‍රික් ටොන් දහස්

බෝගය	2001	2002(අ)	2003(ආ)
වී	279	356	286
තේ	187	185	167
රබර්	9	7	8
පොල්	30	38	39
අනෙකුත් කෙෂ්ත්‍ර බෝග	30	42	58
අනෙකුත් අපනයන බෝග	9	8	10
අනෙකුත්	36	34	24
එකතුව	580	670	592

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය

හේතුවෙන් රබර් සහ පොල් වගා අංශ සඳහා පොහොර නිකුතුව ඉහළ ගියේය.

2002 වසරේ ඔක්තෝබර් මාසයේ සංශෝධනය කරන ලද පොහොර සහනාධාර ක්‍රමය 2003 වසරේ ද ක්‍රියාත්මක විය. 2003 වසර අවසාන වනවිට යූරියා සඳහා කරන ලද සහනාධාර ගෙවීම් රුපියල් බිලියන 2.5 විය. මෙම සංශෝධිත ක්‍රමය යටතේ යූරියා ට්‍රෙක් ටොන් 1 ක් සඳහා රුපියල් 6,000 ක සහනාධාරයක් යූරියා ආනයනකරුවන්ට ගෙවන ලදී. කෙසේ වෙතත්, ඛනිජ තෙල් මිල ඉහළයාම සහ ප්‍රධාන වශයෙන් ධාන්‍ය නිෂ්පාදනය කරන්නාවූ රටවල් වලින් ඇතිවූ අධික ඉල්ලුම නිසා 2003 වසරේදී ලෝක වෙළෙඳපොළේ යූරියා මිල ඉකුත් වසරට සාපේක්ෂව සියයට 30 කින් ඉහළ ගිය අතර එය දේශීය වෙළෙඳපොළේ යූරියා මිල ඉහළ යාමට හේතුවිය.

බීජ

සහතික කළ බීජ නිෂ්පාදනය පුද්ගලික අංශය විසින් සිදු කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත වී ප්‍රභේදවල මූලික බීජ සහ ලියාපදිංචි කරන ලද බීජ නිෂ්පාදනය කර එම බීජ ලියාපදිංචි බීජ වගාකරුවන්ට සහ ගොවි සංවිධානවලට ගුණනය කිරීම සඳහා නිකුත් කරනු ලැබේ. 2003 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශිත වී ප්‍රභේද 22 ක මූලික බීජ මෙට්‍රික් ටොන් 166 (බුසල් 8,000) සහ ලියාපදිංචි බීජ මෙට්‍රික් ටොන් 1,706 (බුසල් 82,000) ක් පුද්ගලික අංශයේ වගාකරුවන්ට සහ ගොවි සංවිධානවලට නිකුත් කරන ලදී. වසර තුළ නිෂ්පාදිත සහතික කරන ලද බීජ ප්‍රමාණය ඉකුත් වසරට සාපේක්ෂව සියයට 14 න් වැඩි වූ අතර, එය මෙට්‍රික් ටොන් 14,581 (බුසල් 701,000) විය. මෙය ජාතික බිත්තර වී අවශ්‍යතාවයෙන් සියයට 16 ක් වන අතර ඉතිරිය සඳහා ගොවීන් තමන් විසින් නිෂ්පාදනය කරන ලද බීජ යොදාගන්නා ලදී. එම බීජවල ගුණාත්මය සාපේක්ෂව අඩු මට්ටමක පැවතීමට ඉඩ ඇත.

අඩු වියදම් සහිත, වෛරස් වලින් තොර බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා වූ වැඩසටහන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් 2003 වසරේදී ද නොකඩවා සිදු කරන ලද අතර කොන්ත්‍රාත් පදනම මත වගා කරන ගොවීන්ට වැඩිදියුණු කරන ලද බීජ අර්තාපල් ප්‍රභේද ගුණනය කිරීම සඳහා නිකුත් කරන ලදී. 2003 වසර තුළදී බීජ අර්තාපල් ආනයනය මෙට්‍රික් ටොන් 5,030 ක් වූ අතර ඒ සඳහා ආනයන වියදම රුපියල් මිලියන 347 ක් විය.

2003 වසර තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවීන්ට බොදහැරීම සඳහා අනෙකුත් කෙෂ්ත්‍ර බෝගවල මූලික බීජ කිලෝග්‍රෑම් 5,500 ක් සහ ලියාපදිංචි කළ බීජ කි.ග්‍රෑ.15,100 ක් රජයේ ගොවිපලවල ගුණනය කරන ලදී. රජයේ ගොවිපොළවල් සහ කොන්ත්‍රාත් ගොවිපොළවල නිෂ්පාදනය කරන ලද අනෙකුත් කෙෂ්ත්‍ර බෝගවල සහතික කළ බීජ ප්‍රමාණය කිලෝග්‍රෑම් 81,000 ඉක්මවිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2003 වසරේදී ද රජයේ ගොවිපල සහ කොන්ත්‍රාත් ගොවීන් සඳහා සම්මත එළවලු බීජ නිෂ්පාදනය සිදු කරන ලද අතර එම අංශ දෙක සඳහාම නිපදවන ලද සම්මත බීජ ප්‍රමාණය කිලෝග්‍රෑම් 8,900 ක් විය. බීජ වෙළඳාම ලිහිල්කරණය වීමෙන් පසු විදේශයන්ගෙන් හඳුන්වාදෙන ලද එළවළු බීජ ආනයනය සම්පූර්ණයෙන්ම පාහේ පුද්ගලික අංශය විසින් සිදු කරන ලදී. 2003 වසරේ එළවළු බීජ ආනයනය මෙට්‍රික් ටොන් 304 ක් පමණ වූ අතර ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 167 ක් විය.

කෘෂි රසායන ද්‍රව්‍ය

පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 2003 වසරේ කෘෂිරසායන ද්‍රව්‍ය (වල්නාශක, කෘමිනාශක, දිලීරනාශක) අළෙවිය සියයට 6 කින් ඉහළ ගියේය. වල්නාශක අළෙවිය සියයට 22 කින් මෙට්‍රික් ටොන් 3,441 දක්වා ඉහළ ගිය අතර එය මුළු කෘෂිරසායන ද්‍රව්‍ය අළෙවියෙන් සියයට 52 ක් විය. මෙයට ප්‍රතිවිරුද්ධව යමින් කෘමිනාශක සහ දිලීරනාශක අළෙවිය පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 6 කින් අඩුවිය. ගොවීන් වල්නාශක බහුලව භාවිතා කිරීමට හේතුවූයේ පවතින ශ්‍රම හිඟය නිසා අතින් වල්පැළ නෙලීම වියදම් අධික වීමයි.

3.7 වන සම්පත්

වන සම්පත් දෙපාර්තමේන්තුව විදේශීය ණය සපයන ආයතනවල සහය ඇතිව වන වගා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති කීපයක කටයුතු තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී. ආසියානු සංවර්ධන බැංකුව විසින් වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සහ ඉහළ ජලාධාර කළමනාකරණ ව්‍යාපෘතියේ කටයුතු සඳහා ආධාර සැපයීම නොකඩවා සිදු කරන ලදී. මෙම ව්‍යාපෘති යටතේ ස්වාරක්ෂක කලාපවල රෝපණ කටයුතු, ස්වාරක්ෂක කලාප සහ දුව වගාබිම් පවත්වාගෙන යාම, ගෙවතු වගා සංවර්ධනය, උල්පත් සංරක්ෂණය සඳහා පැළ රෝපණය කිරීම, බීජ පැළ නිෂ්පාදනය, ස්වාභාවික වනාන්තරවල මායිම් මිනුම්කරණය වැනි කටයුතු සිදුකරන ලදී.

විශේෂ සටහන 9

නිවර්තන වනාන්තර සංරක්ෂණය කිරීමේ පනත

නිවර්තන වනාන්තර සංරක්ෂණය කිරීමේ අරමුණින් අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල්වලට සපයා ඇති ණය මුදල් ප්‍රදාන (Grants) බවට පරිවර්තනය කිරීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, නිවර්තන වනාන්තර සංරක්ෂණය කිරීමේ පනත 1998 දී නීතිගත කරන ලදී. මෙම ප්‍රදාන වනාන්තර සංරක්ෂණ කටයුතු සඳහා විවිධ අයුරින් යොදාගත හැක. වනාන්තර නැවත වගා කිරීම, ක්‍රමවත් ස්වාභාවික සම්පත් කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වන උද්‍යාන සහ ආරක්ෂිත වන කලාප පිහිටුවීම හා නඩත්තු කිරීම, වන සංරක්ෂණ කළමනාකරණයට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම, සත්ව සහ ශාක විශේෂ ආරක්ෂා කිරීම නිවර්තන වනාන්තර ශාකවල ඖෂධීය භාවිතය හඳුනා ගැනීමට අදාළ පර්යේෂණ කිරීම සහ වනාන්තර තුළ සහ වනාන්තර අවට ජීවත්වන මිනිස් සහ ජන කණ්ඩායම්වල ජීවන තත්වය උසස් කිරීම සඳහා දායකවීම ආදිය එයට ඇතුළත්ය.

සුදුසුකම් ලබන රටවල් සමඟ ඇති කරගන්නා වූ ද්විපාර්ශ්වික ගිවිසුම්වලට අනුව නිවර්තන වනාන්තර සංරක්ෂණය කිරීමේ පනත ක්‍රියාත්මක කරනු ලබයි. දැනටමත් මෙම පනත යටතේ රටවල් 6 ක් ඇමරිකා එක්සත් ජනපදය සමඟ ගිවිසුම්වලට එළඹී ඇත. එම රටවල් නම් බංගලාදේශය, බෙලීස්, එල්සැල්වදෝරය, පැනමා, පීරු සහ පිලිපීන යයි. එම ගිවිසුම් බලපවත්වන කාලසීමාව තුළ මෙම රටවල නිවර්තන වනාන්තර සංරක්ෂණය සඳහා එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 60 ක් උත්පාදනය කරනු ඇත. මෙම ප්‍රදාන මඟින් මූල්‍ය පහසුකම් සපයනු ලබන ව්‍යාපෘති පරිපාලනය කිරීම අදාළ රටේ ස්ථාපනය කරනු ලබන සංවිධානයක් මඟින් සිදු කරයි. මෙම සංවිධානය අදාල රටෙහි රාජ්‍ය නියෝජිතයන්, පාරිසරික නියෝජිතයන් සමාජ සංවර්ධන, විද්‍යාත්මක අධ්‍යාපනික සහ වන සංවිධානවල නියෝජිතයන් සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය නියෝජිතයන් එක් අයෙක් හෝ කිහිප දෙනෙක් ගෙන් සමන්විත වන අතර නිසියාකාර අරමුදල් උපයෝජනය පිළිබඳව පූර්ණ වගකීම දරයි.

මෙම පනත යටතේ ආධාර ලබාගැනීමට සුදුසුකම් ලබා ගැනීමට නම් සංවර්ධනය වෙමින් පවත්නා රට සතුව මහා පරිමාණ වශයෙන් හෝ ප්‍රාදේශීය වශයෙන් සැළකියයුතු ප්‍රදේශයක විහිදුනු නිවර්තන වනාන්තර පැවතිය යුතුය. එමෙන්ම, එම රටවල ප්‍රජාතන්ත්‍රවාදීව තෝරාපත් කෙරෙන ආණ්ඩු පැවතිය යුතු අතර එම රටවල් ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය නාශක වැඩසටහන් සඳහා සක්‍රීයව සහයෝගය දියයුතු අතර ඵලදායී ආර්ථික ප්‍රතිව්‍යුහ කරන වැඩසටහන් එම රටවල ක්‍රියාත්මකව පැවතිය යුතුය. තවද එම රටවල් ජාත්‍යන්තර ත්‍රස්තවාදයට සහාය නොදෙන රටවල් විය යුතු අතර මානව අයිතිවාසිකම් කඩ නොකරන රටවල් විය යුතුය. එක්සත් ජනපද රජය, ශ්‍රී ලංකාව නිවර්තන වනාන්තර සංරක්ෂණය කිරීමේ පනත යටතේ වාසි ලැබීම සඳහා සුදුසුකම් ලබන රටක් ලෙස ප්‍රකාශය පත් කර ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව තවම ඒ සඳහා ගිවිසුමකට එළඹ නැත.

වනාන්තර සංරක්ෂණය කිරීම අතිශය වැදගත් වේ. ලෝකයේ මුළු වනාන්තර ප්‍රමාණයෙන් හරි අඩකට ආසන්න ප්‍රමාණයක් කර්කටක හා මකර නිවර්තනය අතර කලාපයට ඇතුළත වන අතර, එය ලෝකයේ මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් සියයට 6 කට ආසන්න ප්‍රමාණයකි. මෙම ප්‍රදේශය විශාල ප්‍රමාණයක, විවිධාකාර වූ සත්ව ශාක අභිජනන සම්පත් වලින්ද සමන්විත වේ. භෞමික පිහිටීමේත්, දේශගුණයේත්, පසේ ස්වභාවයෙහිත් ඇති ස්ථානීය විවිධත්වය, මෙම ශාක සහ සත්ව විවිධත්වයට හේතුවී ඇත. පඳුරු, පැළෑටි , අපිශාක, ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයින්, උභයජීවීන් හා කෘමීන් වැනි අනෙකුත් ජීවී විශේෂ අතරද මෙම විවිධත්වය දකිය හැක. නිවර්තන වනාන්තර වලින් දැව, දර, පලතුරු සහ ඇටවර්ග, වේවැල්, ඖෂධීය පැළෑටි, අඟුරු සහ මස් ඇතුළු වෙනත් වටිනා නිෂ්පාදනද සැපයේ. දඩයම් කිරීමෙන් සහ මාලු ඇල්ලීමෙන් ජීවත්වන විශාල පිරිසක් මෙකී වනාන්තර ආශ්‍රිතව දිවි ගෙවනු ලැබේ. නිවර්තන වනාන්තර වලින් වෙනත් ආකාරයේ පාරිසරික ප්‍රතිලාභද මිනිසාට සැපයේ. නිවර්තන වනාන්තර මඟින් වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් උරාගෙන පරිසරයට ඔක්සිජන් මුදා හරිනු ලැබේ. එමඟින් වායු ගෝලය පිරිසිදුවන අතරම, වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් අඩුවීම හේතුකොටගෙන, පෘථිවියේ උෂ්ණත්වය ඉහළයාම අඩුවීම සිදුවේ. ගස් වලින් දියපාරවල්වල. ගලායාම පාලනය සිදු කෙරෙන අතර, එමඟින් පාංශු බාදනය සහ ක්ෂණිකව හටගන්නා ගං වතුර අවම කිරීමට උපකාර වේ.

විවිධ විනාශකාරී බලවේගවලින් තම රටෙහි වනාන්තර ආරක්ෂා කර ගැනීම ශ්‍රී ලංකාව සතු වගකීමක් වේ. මේ අනුව බලන කල වනාන්තර සංරක්ෂනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ දී මූල්‍ය සහයෝගීතාවය ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි. කෙසේ වෙතත්, මෙවැනි මූල්‍ය ආධාර සැපයීම්, ශ්‍රී ලාංකිකයන්ට වාසි සලසන ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණ කටයුතු වැඩි දියුණු වන ක්‍රියාකාරකම් මත පදනම් විය යුතුය.

3.10 සංඛ්‍යා සටහන
වන සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා

	අයිතමය	ඒකකය	2001	2002(අ)	2003(ආ)
1.	මුළු වනාන්තර ප්‍රමාණය(ඇ)	හෙක්ටයාර දහස්	2,119	1,942	1,942
	ඝන වනාන්තර(ඈ)	හෙක්ටයාර දහස්	1,583	1,471	1,471
	ලදු කැළෑ	හෙක්ටයාර දහස්	464	472	472
	කඩොලාන	හෙක්ටයාර දහස්	8,687	9,504	9,531
2.	එළි කරන ලද වන බිම් ප්‍රමාණය(ඉ)	හෙක්ටයාර	314	511	950
3.	නැවත වන වගා බිම් ප්‍රමාණය(ඊ)	හෙක්ටයාර	840	661	1,057
4.	වාර්තා වූ වන නීති උල්ලංඝනය කිරීම්	සංඛ්‍යාව	4,344	4,157	3,093
	දැව ප්‍රමාණය	ඝන මීටර	4,201	4,527	2,789
	දැව වටිනාකම	රුපියල් දශලක්ෂ	58.0	47.6	24.1

(අ) සංශෝධිත

මූලය : වන සම්පත් දෙපාර්තමේන්තුව

(ආ) තාවකාලික

(ඇ) 2002 දී ලබාගන්නා ලද චන්ද්‍රිකා ඡායාරූප සහ ගුවනේ දී ගන්නා ලද ඡායාරූප භාවිතයෙන් අළුත් කරන ලද දත්ත කලට අනුව මුළු වනාන්තර ප්‍රමාණයේ කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ඈ) කඩොලාන ඇතුලත් වේ.

(ඉ) ඇස්තමේන්තු කළ

(ඊ) සහභාගිත්ව වන ව්‍යාපෘතිවලට අයත් බිම් ප්‍රමාණ ඇතුලත් නොවේ.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල යටතේ ආධාර සපයන විශ්ව පාරිසරික ක්‍රියාකාරී ව්‍යාපෘතිය මඟින් නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩපිළිවෙලවල් සහ ව්‍යාප්ති සේවා පවත්වාගෙන යාම සිදු කරන ලදී. ලෝක බැංකුව මඟින් ආධාර සපයන ඖෂධීය පැළ ව්‍යාපෘතියේ කටයුතු අනුරාධපුරය, ගාල්ල, මාතලේ, රත්නපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු රජය ඒකාබද්ධව ආධාර සපයන ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියානු ස්වාභාවික සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය එහි මූලික අදියරේ කටයුතු 2003 වර්ෂයේ පෙබරවාරි මස කුරුණෑගලදී ආරම්භ කරන ලදී. වියලි කලාපයේ නොදියුණු ගැමියන්ගේ ජීවන තත්වය සහ ආදායම වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ කටයුතු කරන ඉතා පුළුල් ක්ෂේත්‍රයක පැතිරී ඇති විවිධ නියෝජිත ආයතන අතර සම්බන්ධතාවයක් ඇති කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය ලෙස වන සම්පත් දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි.

සමහර වැවිලි කළමනාකරණ සමාගම් ඵලදායී නොවන බිම්, වන වගා කටයුතු සඳහා විවිධාංගීකරනය කිරීම දක්නට ලැබිණ. මෙය, වැවිලි ක්ෂේත්‍රයට අමතර ආදායම් උත්පාදන මාර්ගයක් මෙන්ම පාරිසරික තත්වයන් වැඩිදියුණු කිරීම සඳහා දායක වන බැවින් මෙම විවිධාංගීකරණ කටයුතු සඳහා රජයෙන්ද දිරිගැන්වීම් සිදු කෙරිනි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනවලට අනුව වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 9,500 ක් විවිධාංගීකරණය කිරීම සඳහා තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ අන්තර්ජාතික සහයෝගිතාව සඳහා වූ ජපාන බැංකුව විසින් ආධාර සපයනු ලබයි.

රාජ්‍ය දැව සංස්ථාව විසින් රාජ්‍ය අංශයට මෙන්ම පුද්ගලික අංශයටද දැව සැපයීම නොකඩවා සිදුකරන ලදී. 2003 වසර තුළදී රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන්, ඉරු කඳන්, ඉරු දැව සහ ඉන්ධන සඳහා යොදා ගන්නා දැව නිෂ්පාදනය 2002 වසරට සාපේක්ෂව ඝන මීටර් 194,000 ක් දක්වා සියයට 6 කින් අඩුවිය.